

PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

2020

වාර්ෂික වාර්තාව

2020 වසර



ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

Public Utilities Commission of Sri Lanka
6th Floor, BOC Merchant Tower, St. Michael's Road,
Colombo 03, Sri Lanka.
T : +94112392607 F: +94112392641
E:info@pucsl.gov.lk W:www.pucsl.gov.lk



අපේ දැක්ම

සීමා මායිම් තුළ, වඩාත් පිරිමැසුම්දායක අයුරින් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් හා උපයෝගිතා සේවා සඳහා සමස්ත ශ්‍රී ලංකා වාසීන්ට සහ එහි සංවර්ධනයට දායක වන්නන්ට ප්‍රවේශයන් සකසන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම.

අපේ මෙහෙවර

වඩාත් සාධාරණ හා තිරසර අයුරින් වර්තමාන හා අනාගත පාරිභෝගිකයන් සඳහා ආරක්ෂිත, විශ්වසනීය සහ සාධාරණ මිලෙන් යුත් යටිතල පහසුකම් සේවා සපයන බවට වගබලා ගැනීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා විෂය පථය තුළ පවත්නා සියළු උපයෝගිතාවයන් නියාමනය.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව දීප්තිමත් අනාගතයක මංපෙත්කරා ළඟා වීමේ අභිලාෂයෙන් පසුවන සමෘද්ධිමත් ජාතියක සිහින බල ගැන්වීමට ප්‍රයත්න දරන අතර මහජන සහභාගීත්වය සහිතව ප්‍රතිපත්ති වෙනස්කම් සඳහා පහසුකම් සැලසීම තුළින් විදුලිය ජල සේවා සහ බනිජ තෙල් කර්මාන්ත ඉහළ නැංවීමේ ජාතික අරමුණක් සඳහා කැපවීමකින් යුතුව ස්වකීය සීමාවෙන් ඔබ්බට කාර්යයන් ඉටුකරයි.

අන්තර්ගතය

	Page
1. සභාපතිතුමාගේ පණිවිඩය	09
2. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	10
3. අප පිළිබඳව	11
4. කොමිෂන් සභාවේ සාමාජිකයින්	12
5. කොමිෂන් සභාවේ කාර්යයන්	13
6. දීර්ඝකාලීන අරමුණු	13
7. අපගේ ජයග්‍රහණ	15
8. විදුලිබල කර්මාන්තය	17
9. බනිජ තෙල් කර්මාන්තය	27
10. ජල සේවා කර්මාන්තය	31
11. පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා	35
12. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා එහි කාර්ය මණ්ඩලය	39
13. 2021 වසර සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සැලැස්ම	42
14. විගණකාධිපතිවරයාගේ වාර්තාව	51
15. මූල්‍ය ප්‍රකාශන 2020 වර්ෂය	61
16. විගණන කමිටු වාර්තාව	81

සභාපතිවරයාගේ පණිවිඩය



ශ්‍රී ලංකාව ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා සුදානම් වෙමින් සිටින අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් වසර ගණනාවක සැලසුම් තුළ මනාව විස්තර කර ඇති ආයෝජන යෝජනාවක් ලෙස විශේෂයෙන්ම විදුලි කර්මාන්තය සැලකෙහි මෙම කර්මාන්තය ද ස්ථාවර නියාමන රාමුවක් සහිතව මනා සේ සහතික කර ඇත.

COVID 19 වසංගතය රට තුළට බලපෑම් කළ 2020 වසර ශ්‍රී ලංකාවට ඉතා අභියෝගාත්මක වසරක් විය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සියලු පාර්ශ්වකරුවන් සමඟ පාර්ශවකරුවන්ට උපකාර කිරීම සඳහා නිර්මාණාත්මක නවෝත්පාදන ක්‍රමවේද සඳහා සම්බන්ධ වීමට උපරිම අවස්ථාවක් ලබා ගත් වසරක් ද විය.

රට අගුළු දමා තිබූ සමයක වුව ද ලංකා විදුලිබල මණ්ඩලයල ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සහ කර්මාන්තයේ ක්‍රියාකාරීන් සමඟ සම්බන්ධ වී ගෘහස්ථ විදුලි ගැටළු සඳහා ආධාර සැපයීම සඳහා හදිසි සේවාවක් දියත් කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමත් විය. අදාළ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව නිවාසවල ජලනල ගැටළු විසඳීම සඳහා ද එකී සේවාව ම ව්‍යාප්ත කරන ලදී.

විදුලි පාරිභෝගික පැමිණිලි විසඳීම වසංගතයත් සමඟ ප්‍රධාන වෙනසකට ලක්වුයේ කාර්යාලවලට පැමිණෙන ලෙසට උපදෙස් නොදුන් බැවිනි. එබැවින් පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ පාර්ශවකරුවන්ගේ කටයුතුවල දී නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට ක්ෂණික දුරකථන සේවාවල මාර්ගගත ක්‍රියාමාර්ග සහ සමාජ මාධ්‍ය හරහා වන මාර්ග ස්ථාපිත කිරීමට අපට හැකි විය.

විදුලි කාර්මිකයින්ට සිය වෘත්තීය හිණිමංපෙතෙහි ඉහළටම ගමන් කිරීමට සහ සිය ජීවන අභිවෘද්ධිය සඳහා ඉවහල් වන විදුලි කාර්මිකයන්ගේ ජාතික රාමුව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා දිස්ත්‍රික්ක වශයෙන් විදුලි කාර්මිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අප විසින් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විදුලි කාර්මිකයන් 80,000කට වැඩි සංඛ්‍යාවක් සිටින නමුත් වෘත්තීය සුදුසුකම් ඇත්තේ ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට පමණි.

ජල සේවා කර්මාන්තය සඳහා නිල වශයෙන් නම් කරන ලද නියාමකයා ලෙස සහ ජල සම්පාදන අමාත්‍යාංශයට උපදෙස් ලබා දීමේ ශක්‍යතාව තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව රටට අවශ්‍ය පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමට සහාය වීම උදෙසා පාරිභෝගිකයින් මුහුණ දෙන ජල ගැටළු හඳුනා ගැනීමේ අරමුණින් වයඹ, නැගෙනහිර සහ දකුණ යන පළාත්වල පාර්ශවකරුවන් සඳහා උපදේශන පවත්වන ලදී. ඉදිරි වසර තුළ ශ්‍රී ලංකාවේ සියලුම පළාත් තුළ පාර්ශවකරුවන් වෙනුවෙන් උපදේශන පැවැත්වීමට අපි සැලසුම් කරමු.

අප විසින් සිදු කරන ලද තවත් කැපී පෙනෙන කාර්යයක් වූයේ පාරිභෝගික කටයුතු අධිකාරියේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා ලිහිසි තෙල් වෙළඳපොලේ පවතින අනවසර ලිහිසි තෙල් වැටලීමයි.

2020 වසර අභියෝගාත්මක වසරක් වුව දල ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ප්‍රශස්ත දැනුමක් ලබා ගැනීමටත් අපගේ පාර්ශවකරුවන්ගේ මෙන්ම රටේ යහපත පිණිස එම දැනුම ලබා දීමටත් හැකි වූ බව මගේ සමාප්ති ප්‍රකාශනයේ දී, මා විසින් පැවසිය යුතුයි.

ජනක රත්නායක
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය



විදුලිබල කර්මාන්තය දියුණු කිරීම, ආයෝජකයින්ට පහසුවෙන් වෙළඳපල ප්‍රවේශය ලබා දීම, විදුලි ආරක්ෂාව සහ සැපයුමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ විදුලිය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ගැටළු විසඳීම සඳහා විදුලි අංශයේ නියාමකයා ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කර ඇත.

විදුලි කර්මාන්තයේ ආරක්ෂණය අංශ, ආර්ථික අංශ සහ තාක්ෂණික අංශ ඵලදායී ලෙස නියාමනය කිරීම, සේවා සපයන්නන් අතර කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ රටේ සංවර්ධනයට දායක වීමේ සමස්ත අභිමාර්ථය පෙරදැරිව පාරිභෝගික අවශ්‍යතා සුරැකීම මගින් මෙය තවදුරටත් වැඩිදියුණු කළ හැකි ය.

ආයතනික ඉලක්ක සහ අනෙකුත් වැදගත් තොරතුරු නිරීක්ෂණය කිරීම සඳහා, අපගේ විනිවිදභාවය, විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන සේවාවන් ලබා ගැනීමේ හැකියාව සහ ඒවායේ ගුණාත්මක බව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම අරමුණු කරගත් මාසික අධීක්ෂණ පද්ධතියක් අප විසින් ස්ථාපිත කර ඇත.උපයෝගිතා සැපයුම්කරුවන් සුමට ක්‍රියාකාරිත්වයට සහායවීම සඳහා, COVID වසංගත කාල සීමාව තුළ, විදුලි බිල්පත් ගෙවීම් සම්බන්ධයෙන් නියාමන මෙවලම් සකස් කර පාරිභෝගිකයින් ගැටලුවකට මුහුණ දෙන අවස්ථාවක අප වෙත ළඟා වීම පීණිස මාර්ගගතව මෙන් ම සමාජ මාධ්‍ය හරහා ද විවිධ ක්‍රම අපි ස්ථාපිත කළෙමු.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සිය උපායමාර්ගික ඉලක්කය සපුරා ගැනීමට සහ නියාමන කාර්ය සාධනය තුළින් පාරිභෝගික තෘප්තිය සහතික කිරීමට ද, සීමා මායිම් තුළ, වඩාත් පිරිමැසුම්දායක අයුරින් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් හා උපයෝගිතා සේවා සඳහා සමස්ත ශ්‍රී ලංකා වාසීන්ට සහ එහි සංවර්ධනයට, දායක වන්නන්ට ප්‍රවේශයන් සකසන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීමේලා වූ අපගේ දැක්ම ප්‍රකාශනය ආයතනික වශයෙන් ස්ථාපනය කිරීම සඳහා ද කැපවී සිටින අතර, සියලුම පාර්ශවකරුවන්ට සාධාරණ හා සමාන අවස්ථාවන්ලබා දීම, පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ රටේ තිරසාර සංවර්ධනය සඳහා කාර්යක්ෂම ගුණාත්මක සේවාවන් සැපයීම ද සහතික කරන්නෙමු.

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පිළිබඳව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව හෝ PUCSL) විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂක හා කාර්මික නියාමක ආයතනය වශයෙන් ජාතික ආර්ථිකයේ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන අතර, ලිහිසි තෙල් වෙළඳපලෙහි සමීප අනුගාමික නියාමක ආයතනය වශයෙන් ද කටයුතු කරයි.

අප විසින් විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සැපයුම හා භාවිතය යන අංශ නියාමනය කරන්නෙමු.

අප විසින් සපයනු ලබන බොහොමයක් වැදගත් සේවාවන් අතර, ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය තුළ විදුලි පාරිභෝගිකයන් සඳහා ප්‍රමාණවත් ආයෝජන, වඩා ඉහළ උපයෝජ්‍යතාවය, කාර්යක්ෂම සැපයුම හා වඩා දියුණු සේවා ගුණාත්මකභාවයක් සපයා දෙනු ලබන බවට කොමිෂන් සභාව විසින් සහතික වේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිය, ජල සේවාව සහ බනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම සඳහා පත් කරනු ලැබ ඇත.

කොමිෂන් සභාවේ අරමුණු, කාර්ය භාරයන් හා නෛතික රාමුව 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යටතේ අර්ථ නිරූපණය කර ඇත.

ජල සේවා හා බනිජ තෙල් කර්මාන්ත නියාමනය කිරීම සඳහා අදාළ පනත් පාර්ලිමේන්තුව හරහා තවම සම්මත කර නොමැති බැවින් නියාමන උපදෙස් ලබා දීමෙන් අපි ජල සේවා හා බනිජ තෙල් කර්මාන්ත සමඟ සමීපව කටයුතු කරන්නෙමු.

පළමු කොමසාරිස්වරුන් කණ්ඩායම හා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරන ලද 2003 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියාත්මක වීම ආරම්භ විය. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය සහිතව ප්‍රතිපත්ති සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් පස් අවුරුදු කාල සීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ආයතනික තොරතුරු

කොමිෂන් සභාවේ නම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

නෛතික තත්ත්වය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලදී

කොමිෂන් සභාවේ සාමාජිකයින්

සභාපති

ජනක රත්නායක

නියෝජ්‍ය සභාපති

මහාචාර්ය ජනක ඒකනායක

සාමාජික

චතුරිකා විජේසිංහ මිය

උදේනි වික්‍රමසිංහ මහතා

මොහාන් සමරනායක මහතා

අධ්‍යක්ෂ ජනරාල්

දමිත කුමාරසිංහ මයා

කොමිෂන් සභාවේ ලේකම්

ජානකී එම්.විතානගම මිය

ලියාපදිංචි කාර්යාලය

6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුණ, ශාන්ත මයිකල් පාර,කොළඹ 3.

විද්‍යුත් තැපෑල: info@pucsl.gov.lk

දුරකථනය: +9411 239 2607/8

ෆැක්ස්: +9411 239 2641

වෙබ් අඩවිය: www.pucsl.gov.lk

විගණකවරුන්

ජාතික විගණන කාර්යාලය
306/72, පොල්දුව පාර,බත්තරමුල්ල.

බැංකුකරුවන්

ලංකා බැංකුව, පළමු මහල, ලංකා බැංකු වෙළඳ කුලුණ,

අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

කොමිෂන් සභාවේ සාමාජිකයින්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව



ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන්

2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත තුළ පනවා ඇති මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් පහත පරිදි වේ:

(අ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත හෝ වෙනයම් කාර්මාන්ත පනතක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී හෝ ලබාදී ඇති බලතල කාර්යයන් හා කර්තව්‍යයන් යොදාගැනීම, ක්‍රියාවෙහි යෙදවීම හා ඉටු කිරීම

(ආ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනතාක් දුරට කොමිෂන් සභාවේ තීරණ තුළින් බලපෑමට ලක්විය හැකි ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ අදහස් විමසීම

(ඇ) කොමිෂන් සභාවට සුදුසු යැයි හැගෙන පරිදි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ විෂය පථය තුළට ගැනෙන ඕනෑම කර්මාන්තයක් සම්බන්ධ සියළු කටයුතු පිළිබඳව රජයට උපදෙස් ලබාදීම,

(ඈ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 15 (4) වගන්තිය යටතේ යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් සම්බන්ධ තොරතුරු රැස් කිරීම වාර්තා කිරීම හා ප්‍රචාරණය කිරීම,

(ඉ) කොමිෂන් සභාව ස්ථාපනය කිරීමෙන් මාස හයක් ඇතුළත කොමිෂන් සභාවේ කාර්යයන් පාලනය කෙරෙන යහ පරිචයන් හා රීති මාලාවක් ඇතුළත් නියාමන අත්පොතක් සකසා එය අවශ්‍ය පරිදි හා අවශ්‍ය විට ප්‍රතිශෝධනය කිරීම

(ඊ) ඕනෑම කර්මාන්ත පනතක් තුළ ප්‍රතිපාදන සලසා ඇති සියළු කරුණු සම්බන්ධ බලපත් ලබාදීමේ, නියාමනය කිරීමේ හා සුපරීක්ෂණය කිරීමේ කාර්යයන් ඉටු කිරීම

(උ) ඕනෑම කර්මාන්ත පනතක අධිකාරිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර, කොන්ත්‍රාත්තු සහ වෙනත් උපකරණවල විධිවිධාන බලාත්මක කිරීම

(ඌ) ඕනෑම කර්මාන්ත පනතක් මගින් අවශ්‍ය කෙරෙන අවස්ථාවන්හි නියාමනය වූ ආයතනයන් විසින් අය කරනු ලබන තීරු බදු හා වෙනත් ගාස්තු නියාමනය කිරීම

(එ) ඕනෑම මහජන උපයෝගිතා කර්මාන්තයක් තුළ ඉස්මතුවන ගැටුම් පිළිබඳ සමථකරණය මගින් තීරණ ගැනීම,

(ඒ) මහජන උපයෝගිතා කර්මාන්තයන්හි ආරක්ෂාකාරී බව ගුණාත්මක බව අඛන්ඩතාව සහ විශ්වසනීයත්වය හා සම්බන්ධ තාක්ෂණික හා වෙනත් ප්‍රමිතීන් පනවා බලාත්මක කිරීම

(ඔ) සිය කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් ඵලදායී ලෙස ඉටුකිරීම පිණිස කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සැලකිය හැකි වෙනත් ආනුෂාංගික හෝ අනුපූරක කාර්යයන් ආරම්භ කිරීම

දීර්ඝ කාලීන අරමුණු

විදුලිබලයේ ගුණාත්මකභාවය

අරමුණු 1: පාරිභෝගිකයන් වෙත කෙරෙන විදුලිබල සැපයුම වෝල්ටීයතාවය 230 V ± 6% හා සංඛ්‍යාතය හා ප්‍රසංවාදය 50 Hz ± 0.5% මට්ටමෙහි වූ ව්‍යවස්ථාපිත ගුණාත්මක මට්ටම හා අනුගත වීම

සැපයුමේ ගුණාත්මකභාවය

අරමුණු 2: වාර්ෂිකව එක් පාරිභෝගිකයෙකු සම්බන්ධ පද්ධති සාමාන්‍ය ඇණ හිටීම් කාල පරිච්ඡේද දර්ශක අගය 24ට අඩු කිරීම.

අරමුණු 3: වසරක් තුළ පාරිභෝගිකයෙකු විසින් අත්විඳින්නාවූ මුළු විදුලිය ඇණ හිටීම් සංඛ්‍යාව 30ට අඩු කිරීම. (සාමාන්‍ය පදනමින්)

අරමුණු 4: පාරිභෝගික සේවා මාර්ග දෝෂ යථා තත්ත්වයට පත් කිරීමේ සාමාන්‍ය කාලය පාරිභෝගිකයෙකු සඳහා පැය 2ට අඩු කිරීම

සේවයේ ගුණාත්මකභාවය

අරමුණු 5: පාරිභෝගිකයන් වෙත අවශ්‍ය වන අවස්ථාවන්හි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ තොරතුරු කල්තබා පාරිභෝගිකයන් වෙත ලබාදීමට පියවර ගැනීම.

අරමුණු 6: පාරිභෝගික විමසුම්/ඉල්ලීම්/පැමිණිලි සඳහා සේවා සම්පාදනයට විදුලි සේවා සම්පාදකයෙකු විසින් ගනු ලබන සාමාන්‍ය කාලය දින 30 ක් දක්වා අඩු කිරීම.

අරමුණු 7: ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන් වෙත සේවා සම්පාදනය සඳහා ගනු ලබන සාමාන්‍ය උපරිම කාලය දින 30කට අඩු කිරීම.

විදුලි ගාස්තු හා සේවා ගාස්තු

අරමුණු 8: 2013 වර්ෂයේ විදුලිබල සැපයුම තුළ දැරූ සමස්ත පිරිවැය 10%කින් අඩු කිරීම. (සමස්ත පිරිවැය පවත්නා තත්ත්වයන් තුළ බල උත්පාදක මිශ්‍රණයන් හා ඉන්ධන ගාස්තු සඳහා වූ ගැලපීම්වලට යටත් වේ)

අරමුණු 9: 2013 වර්ෂයේ සේවා සඳහා සේවා සම්පාදකයා විසින් අයකළ ගාස්තු පවත්නා තත්ත්වයන් තුළ10% කින් අඩු කිරීම.

විදුලි ආරක්ෂාව

අරමුණු 10: මාරාන්තික විදුලි අනතුරු සංඛ්‍යාව වසරකට 20ට අඩු අගයක් බවට පත් කිරීම

විදුලිබල ඉල්ලුම

අරමුණු 11: රටතුළ පවත්නා විදුලිබල ඉල්ලුම නිරතුරු සංතෘප්ත කෙරෙන බවට වගබලාගනු පිණිස 2020 වනවිට නොකඩවා අවම සියයට 10ක සංචිත ආන්තිකයක් පවත්වා ගැනීම.

සංරක්ෂණය හා කාර්යක්ෂම භාවිතය

අරමුණු 12: උපයෝගිතා පාදක බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් මගින් වසර 2020 වනවිට අවම වශයෙන් බලශක්ති ගිගාවොට් පැය 250ක් හා ධාරිතාවය මෙගාවොට් 30ක් ආරක්ෂා කර ගැනීම.

2020 වසරේ අපගේ ජයග්‍රහණ

2020 වසර ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු ලෝකයටම අභියෝගාත්මක වසරක් විය. COVID 19 වසංගතය අපගේ ජීවන මාර්ග මෙන් ම අප මෙහෙයවන සහ අන්තර් ක්‍රියාකාරකම් සිදු කරන රටාවන් ද වෙනස් කළේය. පුද්ගලයින් සහ කාර්යයන් එකිනෙකට සබැඳිව පවත්වා ගැනීම සඳහා තාක්ෂණය විශාල කාර්යභාරයක් ඉටු කළේ ය.

බහුවිධ අංශ නියාමනය කරන ආයතනයක් ලෙස, අභියෝග මධ්‍යයේ වුව ද 2020 වර්ෂයේ දී වැදගත් සන්ධිස්ථාන බොහොමයක් කරා ළඟාවීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමත් විය.

ඇඳිරි නීතිය පවැති කාලය තුළ විදුලි කාර්මික හා ජලනල කාර්මික සේවාවන් බාධාවකින් තොරව ලබා ගැනීම පිණිස හදිසි සේවාවක් ස්ථාපිත කිරීම, විදුලි පාරිභෝගිකයින්ගේ ගැටළු ලබා ගැනීමට සහ විසඳීමට මාර්ගගත ක්‍රම සහ සමාජ මාධ්‍ය නාලිකා පිහිටුවීම, පානීය ජලය සම්බන්ධ වඩා හොඳ ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ අරමුණින් පානීය ජල ගැටළු හඳුනා ගැනීම සඳහා ජල පාරිභෝගිකයින් සහ නිලධාරීන් සමඟ පාර්ශවකරුවන්ගේ උපදේශන මාලාවක් පැවැත්වීම, විදුලි කාර්මිකයින්ට බලපත්‍ර ලබාදීම් පද්ධතියේ ජාතික රාමුව යටතේ වෘත්තීය බලපත්‍රය ලබා ගැනීමට විදුලි කාර්මිකයන් දැනුවත් කිරීම සහ ශ්‍රී ලංකාවේ අනවසර ප්‍රමිතියෙන් තොර ලිහිසි තෙල් හඳුනාගැනීම සඳහා වැටලීම් සිදු කිරීම අපගේ ජයග්‍රහණවලින් විශේෂ අවස්ථා සමහරකි.

මෙම වාර්තාවට 2020 වර්ෂය සඳහා විදුලිබල කර්මාන්තය, ජල සේවා කර්මාන්තය සහ බනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය, 2021 වර්ෂය සඳහා PUCSL සැලැස්ම සහ නියාමකවරයාගේ මූල්‍ය ප්‍රගතිය වාර්තාවට ඇතුළත් වේ.

විදුලිබල කර්මාන්තය



ප්‍රතිඵලය 01

01 වන ප්‍රතිඵලය - ප්‍රතිඵලය 01 - වැඩිදියුණු කළ ඵලදායිතාව සහ විදුලි පාරිභෝගිකයන් සඳහා පහසුව

අදාළ නීති සහ මාර්ගෝපදේශවලට අනුකූලව පාරිභෝගික දුක්ගැනවිලි සහ බලපත්‍රලාභී උපදෙස් ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම

වසර 2019	වසර 2020
463 පැමිණිලි	700 පැමිණිලි

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යය න්‍යාය පත්‍රයේ පාරිභෝගික පැමිණිලි සහ දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ පහසුකම් සැලසීම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පුර්ව වර්ෂයන්ට සාපේක්ෂව පාරිභෝගිකයන්ගෙන් සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් ඉහළ පැමිණිලි සංඛ්‍යාවක් 2020 වසරේ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලැබී ඇත. 2019 වසරේ ලැබුණු පැමිණිලි 463ට සාපේක්ෂව 2020 වසරේ පැමිණිලි 700ක් ලැබී ඇත. COVID 19 ඇඳිරි නීති සමය තුළ සහ රට අගුලු දමා තිබූ කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟින් සන්නිවේදනය කිරීම සඳහා ක්ෂණික ඇමතුම් අංකයක්, මාර්ගගත ක්‍රියාමාර්ග සහ සමාජ මාධ්‍ය හරහාවන ක්‍රියාමාර්ග හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය සිදු විය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිලධාරීන් සෑම කටයුත්තක දී ම තම සේවාවන් ලබා දෙන අතරම, රාජකාරී අවශ්‍යතාවයන් සහිත පාරිභෝගිකයින් සඳහා ඒ සඳහා වේලාවන් වෙන් කර දෙන ලදි. පාරිභෝගිකයින් විසින් ඉදිරිපත් කරන ලද ගැටළු නිරාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභීන් අතර සන්නිවේදන 1701 ක් සිදු කරන ලදී.

බොහෝ පැමිණිලි විදුලි අවසර ගැටළු සහ මනු ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙනි. 2019 වර්ෂය සහ 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි ප්‍රමාණය පහත වගුවේ සංසන්දනය කර ඇත.

	2019		2020	
වර්ගය	සිද්ධීන් සංඛ්‍යාව	ලිපි හුවමාරු කිරීම් සංඛ්‍යාව	සිද්ධීන් සංඛ්‍යාව	ලිපි හුවමාරු කිරීම් සංඛ්‍යාව
නව සබඳතාවයන්	61	159	54	115
විසන්ධි කිරීම් සහ නැවත සම්බන්ධ කිරීම්	16	30	15	36
බිල්පත් ආශ්‍රිත	36	73	105	168
මනු ආශ්‍රිත	22	72	13	37
විදුලි මාර්ග අවසර	163	431	102	267
ගුණාත්මකභාවය සම්බන්ධ	36	85	30	70
ගාස්තු කාණ්ඩය වෙනස්වීම්	11	43	12	26
අනෙකුත්	118	306	79	186
එකතුව	463	1199	410	905

කොවිඩ් වසංගත කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි පාරිභෝගික පැමිණිලි විසඳීමට සහ පරිශ්‍රයේ සිටින නිලධාරීන් වෙත නොපැමිණ අන්තර්ජාලය හරහා පාර්ශ්වකරුවන්ගේ ගැටලු විසඳීම සඳහා ක්ෂණික දුරකථන සේවාවක් දියත් කරන ලදී" එබැවින්, කොවිඩ් -19 ඇඳිරි නීතිය කාලසීමාව තුළ පැමිණිලි 410 ට අමතරව සමාජ මාධ්‍ය හරහා දුරකථන සහ ජංගම වේදිකාවන් (Whatsapp" viber ආදිය) හරහා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව ආසන්න වශයෙන් 700 කි" සියලුම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

විදුලි (ආරවුල් විසඳීම) රීතිවලට අනුකූලව ආරවුල් විසඳීම

ගැටලුවට සම්බන්ධ පළමු පාර්ශ්ව දෙක හරහා පැමිණිල්ල විසඳා ගත නොහැකි වූ විට, එය ආරවුලක් බවට පත්වේ" ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද ආරවුල් නිරාකරණය කිරීමේ නීතිරීතිවලට අනුව ආසන්න වශයෙන් ආරවුල් 15ක් පමණ විසඳීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය කරන ලද අතර බෙදාහැරීමේ බලපත්‍රලාභියා සහ තීරුබදු පාරිභෝගිකයා අතර පැන නැගුණු ආරවුල්වලට අදාළව සමථකරණ සැසි 04ක් සම්පූර්ණ කරන ලදී" ආරවුල් නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය තුළින් පාරිභෝගිකයින්ට නීතිමය ක්‍රියාවලියකට අවතීරණය නොවී ඔවුන්ගේ ගැටළු ඉක්මනින් විසඳා ගැනීමට උපකාරී වේ.

LECO සමඟින් විදුලි (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි (වාණිජ ගුණාත්මකභාවය) ක්‍රියාත්මක කිරීම

බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ (පාරිභෝගිකයින්ට විදුලිය බෙදාහරින පාර්ශ්ව) වාණිජ ගුණාත්මකභාවය මැනීම 2019 වර්ෂයේ දී 2016 අංක 1975/44 දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ආරම්භ විය. 2020 දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලංකා විදුලි සමාගම් (LECO) සඳහා ඔවුන්ගේ පාරිභෝගික සේවා කාර්ය සාධන ඉලක්ක මැනීම සඳහා දත්ත ආකෘතිපත් නිර්මාණය කරන ලදී. ලැබුණු දත්ත සමඟින්, කාර්ය සාධන සම්මත නියාමනය තුළ හඳුනාගෙන ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් LECO හි කාර්ය සාධනය ඇගයීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ආරම්භ කරන ලදී. මේ හරහා සියලුම පාර්ශ්වකරුවන්ට ගුණාත්මක සේවාවක් සැපයීමට උපකාර වන උපයෝගිතා සේවාව වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සැලසුම් කරය.

පාරිභෝගික පරිශ්‍රවල විදුලි මනු මාරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශය

විදුලි මනු මාරු කිරීම බලපත්‍රලාභීන්ගේ පාරිභෝගික සේවයේ කොටසකි. එබැවින්, මෙම මාර්ගෝපදේශය විදුලි මනු මාරු කිරීමේ ක්‍රියා පටිපාටිය ක්‍රමානුකූල කිරීමට හේතු වනු ඇත. පාරිභෝගික පැමිණිලි සහ ආරවුල් විසඳීමේ පහසුව සඳහා විදුලි මනු මාරු කිරීමේ මාර්ගෝපදේශය ක්‍රියාවේ යෙදවීමට නියමිතය. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාර්ශ්වකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් මාර්ගෝපදේශයේ පළමු කෙටුම්පත සම්පූර්ණ කර 2020 වර්ෂයේ දී බලපත්‍රලාභීන්ගේ අදහස් සහ නිරීක්ෂණ සඳහා යොමු කරන ලදී. විදුලි මෙනුවක් වෙනත් ස්ථානයකට මාරු කිරීමේ ඉල්ලීම් ක්‍රියාවලිය, අනුමත කිරීමේ ක්‍රියාවලිය, පිරිවැය සහ කාල රාමු සම්බන්ධයෙන් කෙටුම්පත් මාර්ගෝපදේශය කටයුතු කරයි.

විදුලි පාරිභෝගිකයන්ගේ පැමිණිලි විසඳීමට පළාත් ජංගම සේවාවක්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම පුද්ගලික සමාගම එක්ව විදුලි පාරිභෝගිකයන්ගේ පැමිණිලි විසඳීම සඳහා දිවයින පුරා සිදුකරන පළමු පළාත් ජංගම සේවාව 2020 සැප්තැම්බර් මාසයේ දී දකුණු පළාතේ විදුලි පාරිභෝගිකයින් 500කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් දියත් කරන ලදී.

පාරිභෝගිකයින්ගේ විදුලි පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කරමින් සහ ඉන් අනතුරුව ඔවුන්ට විසඳුමක් හෝ ක්‍රියා පටිපාටියක් ඉදිරිපත් කරමින්, තොරතුරු සොයන පාරිභෝගිකයන් සමඟින් නියාමන මෙවලම් බෙදාහදා ගැනීම, උපයෝගිතා සපයන්නන් විසින් නව සේවාවන් හඳුන්වාදීම, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ බලතල යටතේ පවතින විදුලි මාර්ග අවසර දීම් සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් ලබා දීම පිණිස ජංගම සේවාවන් සෑම පළාතකම පැවැත්වේ.

දකුණු පළාත් ජංගම සේවයේ සංඛ්‍යාලේඛනවලට අනුව පැමිණිලි 500 ක් පමණ ලැබී ඇති අතර පරිශ්‍රයේ ඇති සියලුම ගැටලු සඳහා විසඳුම් ලබා දී ඇත. බොහෝ පැමිණිලි විදුලි මාර්ග අවසර දීම්, බෙදා වෙන් කළ ඉඩම් (වෙන්දේසි කළ) සඳහා විදුලිය සැපයීම, විදුලි මනු මාරු කිරීම, නව සම්බන්ධතාවයන් සහ විදුලි සම්බන්ධතාවල නම වෙනස් කිරීම සම්බන්ධයෙන් විය.

පාරිභෝගික උපදේශක කමිටු (CCC) සම්බන්ධීකරණය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 29 වැනි වගන්තිය යටතේ පාරිභෝගික උපදේශක කමිටුව (CCC) පත් කරනු ලැබේ. පළාත් නවය නියෝජනය කිරීම සඳහා පුද්ගලයින් 9 දෙනෙකු විදුලිය, බනිජ තෙල් හා ජල සම්පාදන සේවා කරමාන්ත වැනි එක් එක් මහජන උපයෝගිතා කර්මාන්තයට සම්බන්ධ හා දැනුම ඇති පුද්ගලයින් අතරින් කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද පුද්ගලයන් තිදෙනෙකු, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් නම් කරන ලද එක් පුද්ගලයෙක්, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් නම් කරන ලද එක් පුද්ගලයෙක්, සහ ලංකා වාණිජ මණ්ඩලය විසින් නම් කරන ලද එක් පුද්ගලයෙක් ඇතළුව සාමාජිකයින් 15 දෙනෙකුගෙන් පාරිභෝගික උපදේශක කමිටුව සමන්විත වේ. යෝග්‍ය ප්‍රමිතීන්, දැනුවත් කිරීම් ප්‍රවර්ධනය, පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සපුරාලනු ලබන ආකාරය නිරීක්ෂණය කිරීම සහ යනාදිය පිළිබඳව පාරිභෝගික උපදේශක කමිටුව කොමිෂන් සභාවට උපදෙස් දෙයි. 2020 වර්ෂයේ දී, පාරිභෝගික උපදේශක කමිටු සාමාජිකයින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි පාර්ශ්වකරුවන්ගේ උපදේශන සඳහා වටිනා ආදානයන් ලබා දුන් අතර, 2020 වසර සඳහා අලුතින් හඳුන්වා දුන් නියාමන මෙවලම් මුවහත් කිරීමට ද කොමිෂන් සභාවට උපකාර කළහ.

බලපත්‍ර අයදුම්පත් සහ නිදහස් කිරීම් (නව ඉල්ලුම් කිරීම්, වෙනස් කිරීම්, දිගු කිරීම්) ඇගයීම සහ බලපත්‍ර ප්‍රදානය කිරීම සහ ඉන්වොයිසිකරණය

විදුලිබල පනතට අනුව, විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. මෙය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි නැවත සිදුවන ක්‍රියාකාරකමකි. ඒ අනුව, 2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත බලපත්‍ර ඉල්ලීම් අයදුම්පත් 49ක් ලැබුණු අතර ඉන් 31ක් ප්‍රදානය කර ඇත.

වසංගත කාල සීමාව තුළ විදුලි බිල්පත් ගෙවීමට නව මාර්ගෝපදේශයක්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) සමඟ එක්ව විදුලි පාරිභෝගිකයින්ට මාසික විදුලි බිල්පත් නිකුත් කිරීමේ දී සාධාරණත්වය සහතික කිරීම, COVID-19 වසංගත කාල සීමාව තුළ මාසික බිල්පත් ගෙවීමට සහන කාලයක් ලබා දීමෙන් උපයෝගිතා සේවා සපයන්නන්ගේ මූල්‍ය තත්ත්වය සහතික කිරීම සහ ප්‍රතිසාධනය කිරීම සඳහා මාර්ගෝපදේශයක් ඉදිරිපත් කරන ලදී.

බිල්පත් නිකුත් කිරීම ප්‍රමාද වුව ද සහන මිලට ලැබෙන විදුලි ඒකක සංඛ්‍යාව අනුව (අනුපාත පදනමින්) විදුලි බිල්පත් ගණනය කිරීමට සහ විදුලි බිල්පත් පියවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීමට මාර්ගෝපදේශ සකස් කර ඇත. මාර්ගෝපදේශ සකස් කිරීමේ දී ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මෙන්ම විදුලි පාරිභෝගිකයින් කිහිප දෙනෙකුගේ පැමිණිලි ද සැලකිල්ලට ගන්නා ලදී.

පාරිභෝගිකයින්ට උපරිම සාධාරණය ඉටු කිරීම සහතික කිරීම සඳහා නිරෝධායන ඇඳිරි නීතිය කාල සීමාවට යටත් වූ බිල්පත් සකස් කිරීම සඳහා පහත නිර්දේශ ක්‍රියාත්මක කරන ලදී.

1. නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීමෙන් පසු සහ මනුවේ අවසන් කියවීමෙන් පසු නිකුත් කරනු ලබන සියලුම බිල්පත් විදුලි ඒකක සඳහා සහනදායී අනුපාතය සඳහා සුදුසුකම් ලැබීම (අනුපාත පදනමින්) තහවුරු කරමින් මාසික පදනමින් සහ එක් එක් මාසය සඳහා වෙන වෙනම බිල්පත් ලෙස නිකුත් කළ යුතුය.

2. පාරිභෝගිකයාට නිකුත් කරන ලද වෙන් වූ බිල්පත් ගෙවීම සඳහා ලබා දී ඇති සහන කාලය ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව අදාළ සහන කාලය සහ කොන්දේසි ප්‍රකාශයට පත් කරන තුරු මෙම බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් විදුලිය විසන්ධි කිරීමක් සිදු නොවේ.

3. අවසාන මෙනු කියවීම සහ ඊළඟ මෙනු කියවීම අතර කාල පරතරය බිල්පත් වාර එකකට වඩා වැඩි විය හැකි ය.එබැවින්, එම කාලසීමාව සඳහා වන මුළු පරිභෝජනය (විදුලි ඒකක) බිල්පත් නිකුත් කිරීමේ දී එක් එක් බිල්පත් කාල සීමාව හෝ මාසය සඳහා (අනුපාත පදනම හෝ සහනදායී විදුලි ගාස්තු තහවුරු කිරීම) සමානව බෙදී යනු ඇත. ඒ සමඟින් මාස කිහිපයක් ඇතුළත විදුලි පාරිභෝගිකයා විසින් පරිභෝජනය කරන මුළු විදුලි ඒකක ප්‍රමාණය බිල්පත් සකස් කිරීමේ දී සාධාරණ ලෙස එක් එක් මාසය සඳහා සකස් කර වෙන් කළ හැකි ය.මේ අතර, සමහර පාරිභෝගිකයින්ට මනුව නිවැරදිව කියවීමකින් තොරව ඇස්තමේන්තුගත බිල්පතක් දැනටමත් ලැබී තිබිය හැකිය. ඇස්තමේන්තුගත බිල්පතේ විදුලි ඒකක සහ මනුව කියවීමෙන් පසු නිකුත් කරන ලද ඒකක ගණන අතර වෙනසක් තිබේ නම්, එම වෙනස ඊළඟ බිල්පත කියවීමෙන් පසු සංශෝධනය කෙරේ. එවැනි සංශෝධන තිබේ නම් පාරිභෝගිකයාව දැනුවත් කරනු ලැබේ.

4. නිකුත් කර ඇති වත්මන් හෝ ඉදිරි බිල්පත් සම්බන්ධයෙන් පැමිණිලි ඇත්නම් නියමිත වේලාවට බිල්පත් නිකුත් කරන තුරු විදුලි සම්බන්ධතා විසන්ධි නොකෙරේ. ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම එවැනි පාරිභෝගික පැමිණිලි කඩිනමින් විසඳනු ඇත.තම විදුලි බිල්පත් පැමිණිල්ල සම්බන්ධයෙන් ලබා දී ඇති විසඳුමට පාරිභෝගිකයා එකඟ නොවන්නේ නම්, පාරිභෝගිකයාට තම ගැටලුව මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත යොමු කළ හැකිය.

02 වන ප්‍රතිඵලය - පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිල සහ බලපත්‍රලාභීන් තිරසාර මූල්‍ය ස්ථායීතාව

කිසියම් විදුලි මිටරයක ලේඛනයේ සැකකටයුතු වෙනස්කම් විමර්ශනය කිරීම සඳහා මාර්ගෝපදේශ

විදුලි මෙනු ලේඛනයේ සැකකටයුතු වෙනස් කිරීම් සම්බන්ධයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) විසින් සිදු කරන ලද විමර්ශනවලට අදාළ පැමිණිලි සැලකිය යුතු සංඛ්‍යාවක් මහජන උපයෝගිතා කොමිසම වෙත ලැබේ. හඳුනාගෙන ඇති හේතු ලෙස ප්‍රධාන වශයෙන් ම එවැනි පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියා පටිපාටියක් නොතිබීම සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් එවැනි පරීක්ෂණ පැවැත්වීමේ නොගැලපීම වේ. තවද, එවැනි විමර්ශනයක් තුළ දී බෙදාහැරීමේ බලපත්‍රලාභී කාර්ය මණ්ඩලයේ ක්‍රියාදාමයන් ඇතැම් විට ඉතා අවිනීත වන අතර පාරිභෝගිකයන් බිය ගැන්වීමට පවා පසුබට නොවන බව ද දැන ගැනීමට ලැබී ඇත. එවැනි සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීමේ දී, බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ ද අයිතිය ආරක්ෂා කරමින් එවැනි විමර්ශනවලදී බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අනුගමනය කළ යුතු නිසි මාර්ගෝපදේශක අවශ්‍යතාවය පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඉතා වැදගත් වී තිබේ.

මාර්ගෝපදේශය සැකසීමේ දී ඕනෑම විදුලි මිටරයක ලේඛනයේ සැකකටයුතු වෙනස් කිරීම් විමර්ශනයට අදාළ නීතිමය සහ නියාමන රාමුව අධ්‍යයනය කිරීම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගම විසින් භාවිතා කරනු ලබන ඕනෑම විදුලි මිටරයක ලේඛනයේ සැකකටයුතු වෙනස් කිරීමක් විමර්ශනය කිරීම සඳහා පවතින මාර්ගෝපදේශ හෝ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ කිසියම් විදුලි මනු ලේඛනයක සැකකටයුතු වෙනස් කිරීමක් විමර්ශනය කිරීම වන මාර්ගෝපදේශ සහ/හෝ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් ප්‍රශස්ත ජාත්‍යන්තර පරිචයන් සමාලෝචනය කිරීම සිදු කරන ලදී.

ඒ අනුව,2020 වර්ෂයේ දී, පාරිභෝගිකයා සහ උපයෝගිතා සපයන්නන් යන දෙඅංශයෙන්ම ප්‍රතිලාභ ලබන විමර්ශනයක දී අනුගමනය කළ යුතු පියවර, කාල රාමු, බලය පැවරීමේ ක්‍රියාවලිය සහ අනුමැති ක්‍රියාවලිය ඇතුළුව, අදාළ නීති, රෙගුලාසි, රීති, කේත, ක්‍රමවේදවලට අනුකූල වන ඕනෑම විදුලි මිටරයක ලේඛනයේ සැකකටයුතු වෙනස් කිරීමක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

විදුලි කර්මාන්තය සඳහා වන ආයෝජන ආකර්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති උපදෙස්

පසුගිය වසර 10 තුළ ආයෝජන මට්ටම මඟින් පෙන්නුම් කරන්නේ විශේෂයෙන්ම ඉන්දියාව සහ බංග්ලාදේශය වැනි කලාපීය වෙළෙඳපොළ සමඟ සසඳන විට විදුලි කර්මාන්තයට ආයෝජන ආකර්ෂණයන් නොපැවති බවයි. අකාර්යක්ෂම ප්‍රසම්පාදන පිළිවෙත් සහ මන්දගාමී සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධනය විදුලිබල උත්පාදන ව්‍යාපාරයට පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ප්‍රධාන බාධකයක් ලෙස සැලකේ. අකාර්යක්ෂම ප්‍රසම්පාදන පිළිවෙත් සහ මන්දගාමී සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධනය විදුලිබල උත්පාදන ව්‍යාපාරයට පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ප්‍රධාන බාධකයක් ලෙස සැලකේ.

පාර්ශවකරුවන්ගේ උපදෙස් සමඟින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වත්මන් තත්ත්වය අධ්‍යයනය කළ අතර, සම්ප්‍රේෂණ විවෘත ප්‍රවේශය, විදුලි සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා විදුලි ජාල සාමූහිකව යොදා ගැනීම සහ පුද්ගලික සම්ප්‍රේෂණ ආයෝජන වැනි ව්‍යුහාත්මක වෙනස්කම් ලෙස (රෙබීය සහ අනුබද්ධ සේවා) කර්මාන්තයේ ආයෝජන ප්‍රවර්ධනය කළ හැකි ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය සඳහා වඩා හොඳ ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කළ යුතු දේ පිළිබඳ ප්‍රතිපත්තිමය උපදෙස් ලෙස යොමු කරන ලද වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

විද්‍යුත් ජාලයේ එක් ස්ථානයක දී ජනනය වන විදුලිය ජාලයේ තවත් ලක්ෂ්‍යයකට සම්ප්‍රේෂණය කිරීම ගැන සඳහන් වන විදුලි සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා විදුලි ජාල සාමූහිකව යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳ ප්‍රතිපත්ති පත්‍රිකාවෙන් සාකච්ඡා කෙරේ (උත්පාදකයේ ජාල සීමාවෙන් ඔබ්බට). අත්‍යවශ්‍යයෙන්ම, සම්ප්‍රේෂණ සහ/හෝ බෙදාහැරීමේ ජාල ක්‍රියාකරුවන් මෙම උත්පාදන කරුවන් වෙත තම ජාලය කුලියට දෙනු ඇති අතර, එමඟින් ඔවුන්ගේ විදුලිය ජනන ස්ථානයට දුරින් පිහිටි තෙවන පාර්ශවයකට විකිණීමට ඉඩ සලසයි.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 16 (ආ) වගන්තියට අනුව, විදුලිබල උත්පාදන බලපත්‍රලාභියා විසින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට එහි සම්පූර්ණ නිෂ්පාදනය අලෙවි කළ යුතු අතර (හුදෙක්ම සහ පමණක්) එමඟින් විදුලි සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා විදුලි ජාල සාමූහිකව යොදා ගැනීමට අවශ්‍යයන්ම අවසර නොදේ.

මේ අනුව, විදුලි සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා විදුලි ජාල සාමූහිකව යොදා ගැනීමට ඉඩ දීම සඳහා, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 16 (ආ) වගන්තිය, කර්මාන්තයේ වැඩි පුද්ගලික අංශයේ ආයෝජන සඳහා ඉඩ ලබා දෙමින් විදුලි උත්පාදන බලපත්‍රයක් හිමිකරගත හැකි පාර්ශවයන් සීමා කරන එම පනතේ 9(1) වගන්තියට ද සුදුසු සංශෝධන සහිතව අවලංගු කළ යුතු බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හඳුනාගෙන ඇත.

මීට අමතරව, ස්වාධීන සම්ප්‍රේෂණ පද්ධති ක්‍රියාකරුවෙකු ස්ථාපන කිරීම ප්‍රතිපත්ති පත්‍රිකාව මඟින් හඳුනාගෙන ඇති අතර, එය විදුලි උත්පාදන ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය රජයේ මැදිහත්වීම් අවම කරන විදුලි උත්පාදන ව්‍යාපාරයේ පුද්ගලික ආයෝජකයින් සඳහා සම අවස්ථා නිර්මාණය කරනු ලබන ආයෝජන සැලසුම් සහ පද්ධති මෙහෙයුම් කාර්යයන්

(රජය විසින් පාලනය කරනු ලබන නමුත් විදුලිබල උත්පාදන යන්ත්‍රාගාර වල අයිතියකින් තොර එවා වඩාත් සුදුසු වේ) සම්බන්ධ වගකීම් දරනු ඇත

03 වන ප්‍රතිඵලය - මහජනතාවගේ, බලපත්‍රලාභීන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ දේපල සහ සෑම ජීවියෙකුම සඳහා ඉහළ ආරක්ෂාවක් වැඩිදියුණු කිරීම

PUCSL වෙත පවරා ඇති කාර්යයන් අතර, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 4 (1) I වගන්තියට අනුව විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, සැපයුම සහ භාවිතය නිසා ඇතිවන අනතුරුවලින් මහජනතාව ආරක්ෂා කිරීමේ වගකීමක් මහජන උපයෝගිතා කොමිෂන් සභාව සතුව පවතී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභීන් විසින් ආරක්ෂිතව විදුලිය භාවිතා කිරීම සහතික කිරීම සඳහා නියාමන මෙවලම් ගණනාවක් සකස් කර ඇති අතර 2012 වර්ෂයේ දී 18ක් වූ විදුලිසැර වැදීම් සංඛ්‍යාව 2018 වර්ෂයේ දී 89ක් දක්වා අඩු කිරීමට සමත් වූ අතර එය සියයට 50කින් පමණ අඩු වීමකි. ජාත්‍යන්තර මිනුම් සලකුණට අනුව, විදුලි සැර වැදීමෙන් සිදු වන මරණ සංඛ්‍යාව මිලියනය එකක ජනතාවක් සඳහා එක් වසරකට විදුලි සැර වැදීම් එකක් පමණී.

2020 දී ශ්‍රී ලංකාව විදුලි සැර වැදීමෙන් සිදු වූ මරණ 102 ක් වාර්තා කර ඇති බවත් එය 2010 වසරට වඩා සියයට 35 කින් අඩු වී ඇති බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2020 විදුලි සැර වැදීමේ වාර්තාව අනාවරණය කරයි. මෙය මහජනතාව සහ පරිශ්‍රයන් සඳහා විදුලි ආරක්ෂණ පරිසරයක් නිර්මාණය කිරීම සහ ජාත්‍යන්තර මිනුම් සලකුණ කරා ළඟා වීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විදුලි කාර්මිකයන්ට බලපත්‍ර ලබාදීමේ රාමුව, ශ්‍රී ලංකාවේ කෙවෙනි සහ පේනු සඳහා ජාතික ප්‍රමිතිය පරිශ්‍රයට විදුලි රැහැන් වල අවම දුර සහ යනාදිය සම්බන්ධයෙන් නීති රීති ආදිය ඇතුළත්ව විදුලිය ආරක්ෂිතව භාවිතා කිරීම සහ නියාමන මෙවලම් බොහොමයක් හඳුන්වාදීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ගනු ලැබූ විවිධ ක්‍රියා මාර්ග නිසා ඇති වූ ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාව 2020 වර්ෂයේදී විදුලි සැර වැදීම හේතුවෙන් මරණ 102ක් වාර්තා කර ඇති අතර, එය 2010 වසරට වඩා සියයට 35 කින් අඩු වීමක් බව 2020 විදුලි සැර වැදීමේ වාර්තාව අනාවරණය කරයි. ශ්‍රී ලංකාව 2010 වසරේ දී විදුලි සැර වැදීමෙන් මරණ 156ක් වාර්තා කළ අතර, 2012 වසරේ මරණ සංඛ්‍යාව 180ක් වාර්තා කරමින් එම සංඛ්‍යාව ඉහළ ගියේය. කෙසේ වෙතත්, අලුතින් නිකුත් කරන ලද වාර්තාවෙන් පෙන්නුම් කරන්නේ, 2015 සිට වසරකට විදුලි සැර වැදීමේ සංඛ්‍යාව 100 ආසන්නයේ රැඳී ඇති බවයි.

වගාව ආරක්ෂා කිරීම හෝ වන සතුන් මැරීම සඳහා නීතිවිරෝධී ලෙස විදුලි රැහැන් ඇදීම රටතුළ විදුලිසැර වැදීම හේතු කොට ගෙන සිදුවන ඉහළම මරණවලට ප්‍රධානතම හේතුව ලෙස හඳුනාගෙන ඇති අතර, නිවසේ/වැඩබිමේ සුළු පරිමාණ විදුලි අලුත්වැඩියා සහ විදුලි රැහැන් ආශ්‍රිත කටයුතු ද විදුලි සැර වැදීම සඳහා බලපා ඇත. 2020 දී එය විදුලි සැර වැදීමෙන් සිදු වූ මුළු මරණ වලින් සියයට 45 කි.

ශ්‍රී ලංකාවේ ගම්මාන බොහෝමයකට නගන සන්නායක මඟින් විදුලිය සපයන බැවින්, සමහර මිනිසුන්ට සතුන් මැරීමට, වගාවන් ආරක්ෂා කිරීමට හෝ මසුන් ඇල්ලීමට පවා විදුලිය හොඳ මෙවලමක් බවට පත්ව තිබේ. සංඛ්‍යාලේඛනවලට අනුව, ධීවර හා වගා ආරක්ෂාව සඳහා විදුලිය නීති විරෝධී ලෙස භාවිත කිරීම හේතුවෙන් වාර්තා වන විදුලිසැර වැදීමේ සිදුවීම්වලට ගොදුරු වුවන්ගෙන් වැඩි පිරිසක් නීති විරෝධී වැටවල් සවිකළ අයම වෙත.තවද, වන සතුන් මැරීමට අටවන ලද උගුල් මඟින් විදුලි සැර වැදීම නිසා අහිංසක මිනිසුන් රැසක්ද මිය ගොස් ඇති බව, වාර්තාව පවසය.

2020 වර්ෂය තුළ සිදු වූ විදුලි සැර වැදීමෙන් සියයට 54ක් මධ්‍යම, දකුණ සහ වයඹ පළාත්වල වාර්තා වී ඇති අතර, මධ්‍යම සහ දකුණු පළාත් එක්ව විදුලි සැර වැදීම හේතුවෙන් මරණ 40ක් වාර්තා කර ඇත. උතුරු පළාත අඩුම අගය වාර්තා කර ඇත. පසුගිය වසර 5 (2016 - 2020) තුළ සිදුවූ විදුලිසැර වැදීමෙන් සියයට 37ක් දකුණු සහ මධ්‍යම පළාත්වල වාර්තා වූ වාර්තාව පෙන්වා දේ.

2020 වර්ෂය තුළ සිදුවූ විදුලිසැර වැදීම්වලින් සියයට 40ක් ශ්‍රී ලංකාවේ පොලිස් කොට්ඨාශ 39 න් මහනුවර, බණ්ඩාරවෙල, තංගල්ල, රත්නපුර සහ පොළොන්නරුව යන පොලිස් වසම්වලින් වාර්තා වී ඇති බව 2020 වර්ෂය සඳහා වන පළාත් දත්ත මඟින් පෙන්වා දේ. මහනුවර පොලිස් වසමෙන් පසුගිය වසරේ වැඩිම මරණ සංඛ්‍යාව 14 ක් වාර්තා විය. 2016 - 2020 වසර පහ තුළ විදුලි සැර වැදීම හේතුවෙන් සිදු වූ මරණ 45 ක් වාර්තා කරමින් දිවයිනේ ඉහළම ස්ථානය ලෙස මහනුවර පොලිස් කොට්ඨාශය රැඳි සිටී.

2020 වසරේ වාර්තා වූ විදුලිසැර වැදීම හේතුවෙන් සිදු වූ මුළු මරණවලින් සියයට 81ක් පිරිමි වන බැවින්, පිරිමින් විදුලි සැර වැදීම සඳහා වැඩි වශයෙන් නිරාවරණය වන බව නවතම සංඛ්‍යාලේඛන පෙන්වා දේ. වයස අවුරුදු 40 සිට 50 දක්වා වයස් සීමාවේ පසුවන පුද්ගලයින් 2020 දී විදුලි සැර වැදීමෙන් වඩාත් අවදානමට ලක්විය හැකි වයස් කාණ්ඩය ලෙස පෙනී සිටින අතර, එය විදුලි සැර වැදීම හේතුවෙන් සිදු වූ මරණ 102 න් සියයට 19 ක් සඳහා දායක වේ.

ජාත්‍යන්තර මිනුම් ලකුණට අනුව, විදුලි සැර වැදීමේ විභවතාව වසරකට මිලියනයකට එක් (01) විදුලි සැර වැදීමක් පමණී. 2019 දී, ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදීමේ දර්ශකය ගෝලීය මිනුම් ලකුණට වඩා පස් ගුණයකින් වැඩි විය.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මාසිකව සහ වාර්ෂිකව විදුලි ආරක්ෂාව සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ කටයුතු අධීක්ෂණය කරයි. මේ යටතේ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අතීත විදුලි සැර වැදීම් වාර්තා, විදුලි සැර වැදීමේ ප්‍රවණතා සියුම් ලෙස පරීක්ෂා කරන අතර, ආරක්ෂක රෙගුලාසි සහ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම නියාමනය කරයි.

2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි සැර වැදීමේ විශ්ලේෂණ වාර්තාව - 2019,විදුලි සැර වැදීමේ විශ්ලේෂණ වාර්තාව 2020 සකස් කරන ලද අතර, එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන මෙවලම් මුවහත් කිරීමට උපකාරී විය.

මාර්ග සංවර්ධනය සමඟ ඒකාබද්ධ වූ උපයෝගිතා සේවා පිවිසුම් ව්‍යාපෘති සඳහා විශේෂිත වූ ආර්ථික ආකෘතියක් සංවර්ධනය කිරීම

මාර්ග දිගේ නිසි උපයෝගිතා සේවා පිවිසුම් නොමැතිකම නිසා ඉහළින් පිහිටි විදුලි රැහැන් මගින් ජීවිත හා දේපළවලට එල්ල වන තර්ජනය, විශ්වසනීයත්වය පිළිබඳ ගැටළු, ඉදිකිරීම් අවකාශයන්ට බාධා කිරීම් සහ විශේෂයෙන් නාගරික සහ ජනාකීර්ණ ප්‍රදේශවල උපයෝගිතා (විදුලිය, ජලය, ටෙලිකොම්) ඉදිකිරීම් මගින් මාර්ගවලට නිතර හානි වීම වැනි ගැටළු ඇති වී තිබේ. උපයෝගිතා සේවා පිවිසුම් ක්‍රියාත්මක කිරීම මිල අධික වන අතර, එබැවින් මාර්ග බලධාරීන්, උපයෝගිතා සේවා සපයන්නන්, පාරිභෝගිකයින් සහ සාමාන්‍ය ජනතාව විසින් දිගු කාලීනව රැස් කරන ලද සම්පූර්ණ ප්‍රතිලාභ ඇගයීමකින් තොරව, උපයෝගිතා සේවා පිවිසුම් ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘති ආර්ථික වශයෙන් සාධාරකරණය කළ නොහැක. එබැවින්, අරමුදල් සුරක්ෂිත කර ගැනීමට භාණ්ඩාගාරයට හෝ අදාළ ආයතනවලට එත්තු ගැන්වීම පිණිස මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඔස්සේ උපයෝගිතා සේවා පිවිසුම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ සහ පිරිවැය ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වන අතර, එමඟින් මාර්ග ඔස්සේ උපයෝගිතා පිවිසුම් ක්‍රියාත්මක කරනු ලැබීම අවශ්‍ය වේ.

ඒ අනුව 2020 දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ උපයෝගිතා සේවා පිවිසුම් ඒකාබද්ධ කිරීමේ ආර්ථික ඇගයීම සහ සංවේදීතා විශ්ලේෂණය සිදුකිරීමට තීරණ ගන්නන්ට භාවිතා කළ හැකි ආර්ථික ඇගයීම් ආකෘතියක් සකස් කරන ලදී. උපයෝගිතා සේවා පිවිසුම නවතම මාදිලියට ක්‍රියාත්මක කිරීම මගින් විදුලි අනතුරු, වාහන අනතුරු, මාර්ග තදබදය වැනි සිදුවීම් අඩුකර, සේවා සපයන්නන්ගේ විශ්වසනීයත්වය වැඩි කරමින්, විශේෂිත සේවා පිවිසුම් නොමැති වීම සම්බන්ධයෙන් උපයෝගිතා මාරුවීම් සහ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන වියදම් අවම කරයි. එබැවින් උපයෝගිතාවල ආරක්ෂාව සහ ආර්ථිකය වැඩිදියුණු වනු ඇත.

ගෘහස්ථ ජල පොම්ප සඳහා විදුලි ආරක්ෂණ පරිශීලක මාර්ගෝපදේශය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පවරා ඇති කාර්යයන් අතර, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 4 (1) I වගන්තියට අනුව විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, සැපයුම සහ භාවිතය නිසා ඇතිවන අනතුරුවලින් මහජනතාව ආරක්ෂා කිරීමේ වගකීමක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඇත.

2019 දී, නිවාසවල භාවිතා කරන ජල පොම්ප ගෘහස්ථ මට්ටමින් සිදු වූ විදුලි සැර වැදීමේ සංඛ්‍යාවට බලපෑමක් ඇති කරන බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සඳහන් කරයි. එබැවින්, ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ජල පොම්ප සඳහා ආරක්ෂිත පරිශීලක මාර්ගෝපදේශයක් සැකසීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කළ අතර එයට ජල පොම්පයක් ආරක්ෂිතව ක්‍රියා කරන ආකාරය, ජල පොම්පයක් ස්ථාපනය කරන ආකාරය, සහ ගැටළුවක් මතු වුවහොත් ගත යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ අත්පොතක් ඇතුළත් වේ. කෙටුම්පත් මාර්ගෝපදේශය 2020 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී.

ආරක්ෂක විදුලි වැටවල් සඳහා නියාමනය හෝ රීතිය

2018 වසර තුළදී, සොරකම සඳහා ආරක්ෂිත පියවරක් ලෙස සකසා ඇති වෙනත් අයගේ නිවාස පරිශ්‍රවල මායිම් දිගේ ඉදිකර ඇති සජීවී විදුලි වැටවල් මගින් ඔවුන්ගේ ආරක්ෂාව අනතුරේ හෙලා ඇති බව කියමින් පාරිභෝගිකයින්ගෙන් පැමිණිලි රාශියක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලැබුණි. ආරක්ෂක විදුලි වැට සම්බන්ධයෙන් නියාමනයක් ශ්‍රී ලංකාව තුළ නොමැති බව හඳුනා ගන්නා ලදී.

එමනිසා, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදාළ බලධාරීන් සහ පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කර ජනතාවගේ සහ දේපළවල ආරක්ෂාව සහතික කරමින් පාරිභෝගික පරිශ්‍රවල මායිම් ඔස්සේ සවි කර ඇති විදුලි වැටවල ආරක්ෂාව සහතික කිරීම සඳහා රෙගුලාසියක් සකස් කළේය. රෙගුලාසියේ පළමු කෙටුම්පත 2020 වර්ෂයේදී අවසන් කරන ලදී.

විදේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් IET රෙගුලාසිවලට භාරගෙන ඇති ඉදිකිරීම් ව්‍යාපෘතිවල විදුලි ස්ථාපනයන්ගේ අනුකූලතාව සහතික කිරීම.

ශ්‍රී ලංකා ජනතාවගේ සහ ප්‍රවාසිකයින්ගේ විවිධ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිකරන ලද නව සහාධිපත්‍ය සමඟින් ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ වෙළෙඳපොළ වාර්ෂිකව පුළුල් වේ. ශ්‍රී ලංකාව මහල් නිවාස හෝ සහාධිපත්‍ය ඉදිකිරීමේදී රැහැන් ඇඳීම සඳහා IET ප්‍රමිතිය අනුගමනය කරයි. කෙසේ වෙතත්, මෙම රෙගුලාසිය සමහර අවස්ථාවලදී අනුගමනය කර නොමැති බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. එබැවින් 2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියාමනය පිළිපැදීම පිළිබඳ අදාළ සියලු පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවක් පවත්වා ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අදාළ වන තොරතුරු බෙදාහරින ලද අතර, ඒවා සියලු පාර්ශ්වකරුවන්ට රෙගුලාසිය පිළිපැදීමට සහ ප්‍රගුණ කිරීමට සහය වනු ඇත.

ඊට අමතරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේදී ස්ථානීය පරීක්ෂණ තුනක් (03) පවත්වන ලද අතර, ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳව සහාධිපත්‍ය අධිකාරියට උපදෙස් දෙන ලදී.

බලපත්‍රලාභීන්ගේ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ක්‍රමය හරහා නීතිවිරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිත කරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමට සම්බාධක නිර්දේශ කිරීම.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 48 (4) උප වගන්තියට අනුව (සංශෝධිත පරිදි) එකී පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කොමිසමේ ලිඛිත අවසරය ඇතිව හැර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සිදු නොකළ යුතුය.

2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත අවසර අයදුම්පත් 542 ක් ලැබුණු අතර, සියලුම අයදුම්පත් ඇගයීමට ලක් කර අවශ්‍ය විට සහ අවශ්‍ය අවස්ථාවල අනුමැතිය ලබා දෙන ලදී.

පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත හෝ කොමිෂන් සභාවේ නියෝග මත පරීක්ෂණ පැවැත්වීම, විදුලි රැහැන් හෝ පිරියත පරීක්ෂා කිරීම හෝ විදුලිය සැපයීම.

පාරිභෝගිකයින් සහ පොදු ජනතාව විසින් ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ සකස් කර ඇති විධිවිධාන, රෙගුලාසි හෝ රීති උල්ලංඝනය කිරීම සම්බන්ධව (විදුලි (විදුලි පරීක්ෂකගේ කාර්යයන්, රාජකාරි සහ ක්‍රියා පටිපාටි) රෙගුලාසිය -2015 හි 2 වන වගන්තියට අනුව) සහ බලපත්‍රලාභීන්, පාරිභෝගිකයින් සහ සාමාන්‍ය ජනතාව අතර ඇතිවන විදුලිය ආශ්‍රිත ගැටළු සංවර්ධනය සම්බන්ධ පරීක්ෂණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. 2020 වර්ෂයේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් පරීක්ෂණ 08ක් පවත්වන ලදී.

විදුලි පේනු සහ කෙවෙනි ප්‍රමිතිකරණය

ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදීම අවම කිරීමට සහ විදුලි ආරක්ෂාව වැඩි දියුණු කිරීමට දරන ප්‍රයත්නය සමඟින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව බලධාරීන් සහ සංගම් කිහිපයක් සමඟ අඛණ්ඩව කටයුතු කරයි.

2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉහළ ආරක්ෂාවක් සහ ගුණාත්මක බවකින් යුත් විදුලි දිගු එක්ටෙන්ෂන් කෝඩ් extension code නිර්මාණය කිරීමට සහ එහි අවිවුව සකස් කිරීමට මොරටුව විශ්ව විද්‍යාලයක් සමඟ එකතු වෙමින් දේශීය සොකට් සහ ප්ලග් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වැඩිදියුණු කිරීමට තවත් පියවරක් ඉදිරියට තබන ලදී.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය, යෝග්‍යතා නිර්ණායක, අලුත් කිරීමේ ක්‍රියාවලිය, අවලංගු කිරීමේ ක්‍රියාවලිය, වගකීම් සහ වගවීම ඇතුළුව ශ්‍රී ලංකාවේ විදුලි කාර්මිකයන්ට බලපත්‍ර ලබාදීම සඳහා මාර්ගෝපදේශයක් ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලදී.

ප්‍රතිඵල 04 - මිනිසුන් සතුන් සහ ශාක සඳහා වැඩිදියුණු කළ පාරිසරික තත්ත්වයන්

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

උත්පාදනය සහ සම්ප්‍රේෂණ සැලසුම් පිළිබඳ තීරණ ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්ති බෙදාදීමේ දත්ත වාර්තා කිරීම අත්‍යවශ්‍ය වේ. මේ වන විට, සාධාරණ කාල පරාසයන් තුළ සැබෑ පුනර්ජනනීය බලශක්ති බෙදාහැරීම වාර්තා කිරීමේදී පරතරයක් පවතී. දත්ත ඉදිරිපත් කිරීමේ මෘදුකාංග යෙදුම දැනට පවතින බලපත්‍ර තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය සමඟ භාවිතා කිරීමට සංවර්ධනය කරන ලදී.

ලක්විජය බලාගාරයේ පාරිසරික කාර්යසාධනය නියාමනය කිරීම

කොමිෂන් සභාව විසින් සේවයේ යොදවා ඇති විශේෂඥ කමිටුව විසින් සකස් කරන ලද පාරිසරික බලපෑම් අවම කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ලදී. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම මත සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇති බවත් එමගින් බලාගාරයේ ක්‍රියාකාරිත්වය මඟින් ඇති වන අහිතකර බලපෑම අවම කර ගැනීමට හැකි වී ඇති බවත් නිරීක්ෂණය විය. මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පරිසර අධිකාරිය විසින් බලාත්මක කරන ලද රෙගුලාසිවලට අනුව ලක්විජය බලාගාරයේ පාරිසරික කාර්ය සාධනය නිරීක්ෂණය කරන ලදී.

තාප බලශක්ති බාහිර දේ පිළිබඳ පාර්ශ්වකාර තොරතුරු විමසීම

බලශක්ති උත්පාදනය වායු දූෂණය, ජල දූෂණය, විෂ ද්‍රව්‍ය මුදා හැරීම සහ GHG විමෝචනය ඇතුළත් බලපෑම් රාශියක් ඇති කරයි. මෙම සමාජීය සහ පාරිසරික පිරිවැය බාහිර ලෙස හඳුන්වනු ලබන අතර යෙදවිය යුතු උත්පාදන තාක්ෂණයන් සඳහා අවම ආර්ථික පිරිවැය අවබෝධ කර ගැනීම සඳහා එය නිවැරදිව ප්‍රමාණනය කළ යුතුය.

ඉහත කරුණුවලට අනුකූලව, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ .තාප ශක්තියේ බාහිර පිරිවැය ඇස්තමේන්තු කිරීම" පිළිබඳව පාර්ශ්වකාර තොරතුරු විමසීම පවත්වන ලද අතර, වැඩිදුර ඇගයීම සහ අවසන් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ලිඛිත ඉදිරිපත් කිරීම් එකතු කරන ලදී. මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ කළ පළමු පර්යේෂණය මෙය වූ බැවින් මෙම පර්යේෂණය සමාජයට නව දැනුමක් එක් කළේය.

විදුලිය කාර්යක්ෂම භාවිතය සහ සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම

රටේ ආර්ථික සංවර්ධනය හේතුවෙන් බලශක්ති ඉල්ලුම දිනෙන් දින ඉහළ යයි. කෙසේ වෙතත්, ඉල්ලුම වර්ධනයට සමානව බලශක්ති සැපයුම පුළුල් නොවේ. බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය මෙම පරතරය අඩු කිරීම සඳහා සහාය වීමට විශාල විභවයක් ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, කොමිෂන් සභාව විසින් 2020 දී සමාජ මාධ්‍ය අවකාශ සහ වෙබ් මාධ්‍ය හරහා ගෘහස්ථ, වාණිජ සහ කාර්මික පාරිභෝගිකයින් ආවරණය වන පරිදි බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

බනිජ තෙල් කර්මාන්තය



ලිහිසි තෙල් වෙළෙඳපොල වාර්තාව

2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2019 ලිහිසි තෙල් වෙළෙඳපොල වාර්තාව ප්‍රකාශයට පත්කර, කාර්මික විද්‍යාල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ලිහිසි තෙල් ගිවිසුම් අළුත් කිරීම සම්බන්ධීකරණය කරන ලදී.

2019 ලිහිසි තෙල් වෙළෙඳපොල වාර්තාවට අනුව, ලිහිසි තෙල් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සඳහා බලයලත් පාර්ශ්ව (සමාගම/නාමිකයා) එකොළහක් (11) සහ පාර්ශ්ව තුනකට ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් නිශ්චිත සන්නාමය(සන්නාම) යටතේ ආනයනය, අපනයනය, මිශ්‍ර කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදා හැරීම සඳහා බලය ලබා දී ඇත.

2019 වසර තුළ අලෙවි කළ වාර්තා වූ මුළු ලිහිසි තෙල් පරිමාව 62,481 kL වන අතර, එය 2018 දී පැවති ප්‍රමාණයට වඩා 1,786 kL කින් අඩුය. කෙසේ වෙතත්, 2019 දී අලෙවි කළ ලිහිසි තෙල්වල මුළු වටිනාකම රු. බිලියන 28.37 ක් වන අතර, එය 2018 දී පැවති ප්‍රමාණයට වඩා රු. බිලියන 1.03 ක ඉහළ අගයකි. ඒ අනුව, 2018 වසරට සාපේක්ෂව 2019 වසර තුළදී, 2.78%ක විකුණුම් පරිමාව අනුව, ලිහිසි තෙල් වෙළෙඳපොළ සෘණ වර්ධනයක් වාර්තා කර ඇත.

තවද, මුළු ලිහිසි තෙල් අලෙවි පරිමාවේ සෘණාත්මක වර්ධනයේ ප්‍රවණතාවක් 2017, 2018 සහ 2019 වසර තුළදී වෙළෙඳපොලේ නිරීක්ෂණය කළ හැක. 2019 වසර තුළදී, අලෙවි කරන ලද මෝටර් රථ ලිහිසි තෙල් සහ ග්‍රීස් යන දෙකෙහිම පරිමාව 4.87% සහ 9.92% කින් අඩු වී ඇති අතර, අලෙවි කරන ලද කාර්මික ලිහිසි තෙල් සහ සමුද්‍රීය ලිහිසි තෙල් යන දෙකෙහිම පරිමාව 2018 වසර තුළ වාර්තාකළ එවැනි නිෂ්පාදනවලට සාපේක්ෂව පිළිවෙලින් 3.82% සහ 10.70% කින් වැඩි වී ඇත.

2019 වසර තුළ අලෙවි කරන ලද මුළු වාර්තාකළ වාහන ලිහිසි තෙල් පරිමාව 44,950.47 kL වන අතර, එය 2018 දී පැවති ප්‍රමාණයට වඩා 2301.33 kL අඩු අගයකි. අලෙවි කරන ලද මෝටර් රථ ලිහිසි තෙල්වල වඩා පහළ පරිමාව 2019 වසර තුළ අලෙවි කරන ලද ලිහිසි තෙල්වල වාර්තාගත පරිමාවේ සමස්ත සෘණාත්මක වර්ධනයට සැලකිය යුතු ලෙස දායක වී ඇත. එමනිසා, 2015 සිට නිරීක්ෂණය කරන ලද මෝටර් රථ ලිහිසි තෙල් අලෙවි පරිමාවේ ධනාත්මක වර්ධනයේ ප්‍රවණතාවය 2019 වසර තුළ වෙනස් වී ඇත.

තවද, 2019 වසර තුළදී, අලෙවි කරන ලද ඩීසල් එන්ජින් ඔයිල් (තනි ශ්‍රේණිය) පරිමාව 2018 දී පැවති ප්‍රමාණයට සාපේක්ෂව ආසන්න වශයෙන් 10% (1,500 kL) කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර, ඩීසල් එන්ජින් ඔයිල් තනි ශ්‍රේණිය), ෆෝ ස්ට්‍රෝක් මෝටර් සයිකල් ඔයිල්, ටූ ස්ට්‍රෝක් මෝටර් සයිකල් ඔයිල්, ඔටෝමෝටිව් ගියර් ඔයිල් සහ ස්වයංක්‍රීය ට්‍රාන්ස්මිසන් ෆ්ලුඩ්වල පරිමාව 2018 දී පැවති ප්‍රමාණයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී ඇත. පසුගිය වසර තුන තුළ අලෙවි කරන ලද ඩීසල් එන්ජින් ඔයිල් (තනි ශ්‍රේණිය) පරිමාව අඩු වී ඇති අතර, අලෙවි කරන ලද පෙට්‍රල් එන්ජින් ඔයිල් (බහු ශ්‍රේණිය) පරිමාව එම කාලය තුළ වැඩි වී ඇත.

2019 ලිහිසි තෙල් වෙළෙඳපොල දෙස බැල්මක්



ලිහිසි තෙල් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සමාලෝචනය සහ යාවත්කාලීනකිරීම.

ලිහිසි තෙල් වෙළෙඳපොල සඳහා ජායා නියාමක ලෙස රජය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පත් කර ඇත. ව්‍යවස්ථාදායක බලගැන්වීම් දැනට සිදුවෙමින් පවතින අතර, එමගින් පහළ ධාරාවේ පෙට්‍රෝලියම් කර්මාන්තය සම්පූර්ණයෙන්ම නියාමනය කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හැකියාව ලැබේ. ලිහිසි තෙල් වෙළඳපොලේ ජායා නියාමක ලෙස, ලිහිසි තෙල් කර්මාන්තය ලිහිල් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ නියාමන කරුණු පිළිබඳ බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව උපදෙස් ලබා දේ.

2006 දී, ලිහිසි තෙල් වෙළෙඳපොළ තවදුරටත් ලිහිල් කළ විට, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ගුණාත්මක ලිහිසි තෙල්වලට පමණක් වෙළෙඳපොළ තුළ අවසර ලබාදෙන බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ වෙළෙඳපොල ප්‍රවේශ නිර්ණායක සැකසීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට සහාය සහ උපදෙස් ලබා දෙන ලදි.

එබැවින්. 2020 දී. පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමෙන් පසු අවශ්‍ය පරිදි පෙට්‍රල්. ඩීසල්. භූමිතෙල් සහ දුව පෙට්‍රෝලියම් වායු සඳහා දැනට පවතින ශ්‍රී ලංකා ප්‍රමිතීන් පහ සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සම්බන්ධීකරණය කරන ලදී.

අනවසර කලවම් ලිහිසි තෙල් සම්බන්ධයෙන් දිවයින පුරා වැටලීම්

ශ්‍රී ලංකාවේ වෙළෙඳපොල තුළ කලවම් ලිහිසි තෙල්වල පැසුණු කොටසක් පවතින බව ගැඹුරු විශ්ලේෂණයකින් හඳුනාගෙන ඇති අතර. එය මුළු වෙළෙඳපොලෙන් ආසන්න වශයෙන් සියයට 20 ක පමණ වේ. වෙළෙඳපොලේ පැසුණු කොටසක් පැවතීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ ශ්‍රී ලංකා වෙළෙඳපොලේ අනවසර කලවම් ලිහිසි තෙල් සංසරණයයි.

වෙළෙඳපොළේ පවතින අඩු ගුණාත්මක ලිහිසි තෙල් පිළිබඳ පාරිභෝගික පැමිණිලි වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය, නිෂ්පාදනය, බෙදා හැරීම සහ විකුණුම පිළිබඳව විමර්ශනය කිරීමට බලශක්ති අමාත්‍යාංශයේ සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ (CAA) සහාය ඇතිව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සහය ඇතිව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් දිවයින පුරා නීති විරෝධී ලිහිසි තෙල් නිෂ්පාදන වැටලීම් සිදු කරන ලදී.

බනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (PRDS) වෙළෙඳ නාම 22ක් යටතේ ලිහිසි තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ විකුණුම සඳහා සමාගම් 13කට නීතිමය අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්, අනවසර වෙළෙඳ නාම සහ සමාගම් යටතේ ලිහිසි තෙල් වර්ග ශ්‍රී ලංකාවේ වෙළෙඳපොලේ පවත්නා බව හඳුනාගෙන ගන්නා ලදි. මෙම නිෂ්පාදන ඉතා පහළ තත්ත්වයේ බවට හඳුනාගෙන ඇත. මෙම නිෂ්පාදන භාවිත කිරීම නිසා කෙටි කාලයක් තුළ වාහන එන්ජින්වල දෝෂ ඇති වී වැඩි මිලකට අමතර කොටස් ආනයනය කිරීමට හේතු වියහැකි අතර, එය රටේ විදේශ විනිමය කෙරෙහි බලපෑම් ඇති කරයි. මෙම නිතර සිදුවන තාක්ෂණික දෝෂ හේතුවෙන් පාරිභෝගිකයින් දැඩි අපහසුතාවට පත්ව ඇති අතර, අඩු ප්‍රමිතියෙන් යුත් ලිහිසි තෙල් පිළිබඳ මෙම නීතිවිරෝධී වෙළෙඳපොල ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකා රජයට ද විශාල බදු ප්‍රමාණයක් අහිමි වී ඇත.

දීප ව්‍යාප්ත වැටලීම් හරහා නීති විරෝධී ලිහිසි තෙල් නිෂ්පාදන විශාල ප්‍රමාණයක් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

ලිහිසි තෙල් කර්මාන්ත වෙළෙඳපොල විශ්ලේෂණ වාර්තාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලිහිසි තෙල් කර්මාන්තයේ ජායා නියාමකයා ලෙස කටයුතු කරමින් සිටින අතර, කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් බනිජ තෙල් සම්පත් අමාත්‍යාංශයට උපදෙස් දෙමින් සිටී. එමනිසා, තරඟකාරිත්වය, මිල සහ ගුණාත්මකභාවය අනුව පවත්නා වෙළෙඳපොල කාර්යසාධනය ඇගයීම සඳහා මැතකාලීන වසරවල ලිහිසි තෙල් වෙළෙඳපොල දත්ත විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. ලිහිසි තෙල් වෙළෙඳපොල දත්ත වාර්ෂිකව වෙළෙඳපොල තරඟකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අතර, ඒවා වාර්ෂික ලිහිසි තෙල් වෙළෙඳපොල වාර්තාව ලෙස සම්පාදනය කෙරේ. ලිහිසි තෙල් වෙළෙඳපොල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සඳහා වෙළෙඳපොල සංඛ්‍යාලේඛන සවිස්තරාත්මකව අධ්‍යයනය කරන ලද අතර, වඩා හොඳ දැනුවත් කිරීමක් ලබා ගැනීම සඳහා වෙළෙඳපොල තරඟකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් අමතර විස්තර කැඳවන ලදී. වාර්තාව 2020 වසර තුළ අවසන් කරන ලදී.

ජල සේවා කර්මාන්තය



ජල සේවා පාරිභෝගිකයින් සඳහා අයිතිවාසිකම් සහ බැඳීම් ප්‍රකාශය

ජල සේවා කර්මාන්තයේ පාරිභෝගිකයින් සඳහා වන අයිතිවාසිකම් සහ බැඳීම් ප්‍රකාශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS)DB) සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කර, නිසි රාමුවක් තුළ ගැටළු විසඳීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ට උපකාර කරනු පිණිස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ජලය සැපයීම සහ භාවිතය සහ අපජලය එකතු කිරීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයාගේ මූලික අයිතිවාසිකම්, ජලය සැපයීම සහ භාවිතය සහ අපජලය එකතු කිරීම සම්බන්ධයෙන් මූලික බැඳීම්, සම්බන්ධතාවයක්, විසන්ධි කිරීමක් සහ නැවත සම්බන්ධ කිරීමක්, ආරක්ෂක තැන්පතුව, මීටර් සහ මීටර කියවීම යනාදිය සම්බන්ධයෙන් අදාළ නීති රීති එම ප්‍රකාශය තුළ ඇතුළත් වේ.

අවශ්‍ය අනුමැතීන් සඳහා එම ප්‍රකාශය ජල සම්පාදන අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

ජල සේවා පාරිභෝගිකයින්ගේ ගැටළු පිළිබඳ මහජන අදහස් විමසීම

ජල බවුසර් හරහා ජලය සැපයීම සහ පොදු මලාපවහන සේවා ඇතුළුව යම් නාගරික හෝ ග්‍රාමීය ප්‍රදේශයක පොදු ජල සම්පාදන පද්ධතියකින් නල ජලය සැපයීම ඇතුළත්වන ජල සේවා කර්මාන්තයද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ උපලේඛණය තුළ ඇතුළත් කර්මාන්තයකි.

එමනිසා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් ජල සේවා කර්මාන්තයට ද විහිදේ. කෙසේ වෙතත්, උපලේඛණය තුළ ලැයිස්තුගත කර ඇති යම් කර්මාන්තයක් සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ පූර්ණ ක්‍රියාකාරිත්වය එම කර්මාන්තය නියාමනය කිරීම ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන කර්මාන්ත පනතක් බලාත්මක කිරීමත් සමඟ ආරම්භ වේ.

මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සියලුම පානීය ජල ගැටළු ආවරණය වන පරිදි ප්‍රතිපත්ති උපදෙස් සකස් කිරීම සඳහා සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශයක් තෝරාගෙන පළමු අදියර ලෙස වයඹ, දකුණ, මධ්‍යම, නැගෙනහිර පළාත්වල මහජන අදහස් විමසීමක් පැවැත්වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජල සේවාවන්හි පොදුවේ සහ දිස්ත්‍රික්ක අනුව අතුරු වාර්තාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ද පානීය ජලය සම්බන්ධ ගැටළුවලට මූලික හේතු අවබෝධ කර ගැනීමට අවධානය යොමු කළ කණ්ඩායම් සාකච්ඡාවක් සඳහා ගමේ ප්‍රධානීන් හමුවීමට ගම්මාන වෙත ගියේය.

අතුරු වාර්තාව මගින් වයඹ, දකුණ සහ මධ්‍යම පළාත්වල පානීය ජලය සම්බන්ධ ගැටළු සහ ඒ ඒ ප්‍රශ්න සඳහා ගත යුතු විසඳුම් හඳුනාගෙන ඇත.

අමු ජල මූලාශ්‍රවල දූෂකරතා, ජලය හා සනීපාරක්ෂක සේවාවන්හී 2025 ඉලක්ක සපුරාලීමට අවශ්‍ය ආයෝජනවල හිඟකම, කොළඹ පදනම් කරගත් නියාමන ආයතන සමඟ මැදිහත්වන CBOs සහ LGAs සඳහා දූෂකරතා, නියාමන විෂය පථය, පානීය ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වැඩිවන ගැටළු, අපදුව්‍ය සහ මල අපදුව්‍ය බැහැර කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම යනාදිය ඇතුළත් ගැටළු හඳුනා ගන්නා ලදී. මධ්‍යම රජයට වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වන සංරක්ෂණය වැනි ආයතන විසින් පාලනය කරනු ලබන මතුපිට ජල මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීම සඳහා යාන්ත්‍රණ පිහිටුවීම, පානීය ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම නිරදේශ කිරීම සඳහා විද්‍යාත්මක කමිටුවක් පත් කිරීම, වැසී ජලය රැස් කිරීම සහ භාවිතය සඳහා ප්‍රමිතීන් සකස් කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම යනාදිය ඇතුළත් විසඳුම් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලදී. පානීය ජලය සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික් නිලධාරීන් වෙත වාර්තා බෙදා දී, ජල සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

පානීය ජල ගැටළු පිළිබඳ මහජන අදහස් විමසීමේදී දැක්වූ අදහස්

50% ක ජනගහනයට පමණක් ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය ඇත. - ගරු සනත් නිශාන්ත මැතිතුමා, රාජ්‍ය අමාත්‍ය, ග්‍රාමීය සහ ප්‍රාදේශීය පානීය ජල ව්‍යාපෘති සංවර්ධන





මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලුම ගම්මාන වලට ගොස් තිබෙනවා. මා දුටු ප්‍රධාන අඩුපාඩුවක් නම් පිරිසිදු පානීය ජලය නොමැතිකමයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් අපට දක්නට ලැබෙනවා බොහෝ අවස්ථා වලදී රෝගීන්ට පිරිසිදු පානීය ජලය ලබා ගත නොහැක. - ගරු ඒ.එල්.එම්. මුසම්මිල් මහතා, වයඹ පළාත් ආණ්ඩුකාර

ඉදිරි වසර 3 තුළ ශ්‍රී ලංකාවේ සැමට සුරක්ෂිත පානීය ජලය ලබා දීමට රජය සැලසුම් කර ඇති අතර ජල කර්මාන්තය නියාමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

එ.සී.එම්. නසීල් මහතා, අතිරේඛ ලේකම්-සංවර්ධන, ජල සම්පාදන අමාත්‍යාංශය



නිපුණත්වයෙන් යුතු මානව සම්පත්, අනිකුත් සම්පත් හිඟකම, දැනුම සහ තාක්ෂණික උපකරණ නොමැතිකම සුරක්ෂිත පානීය ජල සැපයීමේදී පළාත් පාලන ආයතන මුහුණ දෙන අභියෝග කිහිපයකි.

ජේ.එම්. ඉලංගකෝන් මහතා කොමසාරිස්, පළාත් පාලන -උතුරු, නැගෙනහිර පළාත



පොදු ජල ව්‍යාපෘති වල පරීක්ෂණ පහසුකම ගම්මාන වලට ලබාදී පානීය ජලයේ මිල හා ගුණාත්මකභාවය නියාමනය කළ හැකි නම් ඉතා හොඳයි.

නදුන් ආර්ය සම්පත් මහතා. අධ්‍යක්ෂ- ග්‍රාමීය ජල සම්පාදන අංශය, පළාත් සභාව



ලොකුම ප්‍රශ්නය තමයි ජලය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන අතර සම්බන්ධීකරණයක් නැති කම.

එම්. එම්. රසික සමන්ත මහතා, නිලධාරී, පාතික ප්‍රජා ජල සම්පාධන දෙපාර්තමේන්තුව



බිංගිරියේ ජනතාව ජලය නොමැතිව දුක් විඳිද්දී බිංගිරිය ගම්මානයේ ජලය වෙනත් ගම්මානවලට වාර ගණනකදී ලබාගෙන ඇත.

සරත්චන්ද්‍ර මහතා, නවදර්ශන ප්‍රජා මූලික සංවිධානය.



අපි ගම්මාන 03 කට ජලය සපයන අතර අපගේ විදුලි බිල රු. 8,000.00 සිට රු.50,000.00 ක් දක්වා වෙනස් වන අතර එය අපට දැරිය නොහැකි වී ඇත. අපගේ විදුලි බිල්පත් සම්බන්ධයෙන් යම් සහනයක් ලබා දෙන ලෙස ඉල් සිටිමු.

දිමාලි මහත්මිය, රන්දිය දහර ප්‍රජා මූලික සංවිධානය, ගණේවත්ත



පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධවීම

ශ්‍රී ලංකාවේ විදුලි කාර්මිකයන්ට බලපත්‍ර ලබාදීම පිළිබඳ ජාතික රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ විදුලි කාර්මිකයන් 40,000ක් පමණ සිටින බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇති අතර, විදුලි කාර්මිකයන් සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පිළිබඳ සුදුසුකම් ලබා ඇත්තේ ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පමණි නිවාස හා අනෙකුත් පරිශ්‍රවල වයර් ඇදීම සහ නඩත්තු කිරීම් බොහෝමයක් පිළිගත් සුදුසුකම් නොමැති නමුත් පුහුණුවීම් තුළින් පළපුරුද්දක් ඇති විදුලි කාර්මිකයන් විසින් සිදු කරනු ලබයි. මෙම ගැටළුව විසඳීම සඳහා, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය CIDA, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය NAITA සහ වෘත්තීය පුහුණු අධිකාරියේ VTA සහාය ඇතිව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි කාර්මිකයන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව බලපත්‍ර නිකුත් කිරීම මගින් රට තුළ විදුලි කාර්මිකයන් සඳහා පිළිගත් වෘත්තීය තත්ත්වයක් ස්ථාපිත කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලදී.

නව යාන්ත්‍රණය හඳුන්වාදීමත් සමඟ, සියලුම විදුලි කාර්මිකයන්ට ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා වසර තුනකට (03) පමණක් වලංගු තාවකාලික බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම් 3 (NVQ 3) සහ ඊට ඉහළ සුදුසුකම් ඇති අය ඇගයීම් මණ්ඩලය මඟින් පහසුකම් සපයන ඇගයීමකදී තම දැනුම ඔප්පු කිරීමෙන් පසු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙතින් ස්ථිර බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලබයි. වෘත්තීය සුදුසුකම් නොමැති නමුත් ප්‍රායෝගික අත්දැකීම් ඇති අයට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් පහසුකම් සපයන ක්‍රියාවලියක් හරහා නිපුණතාවය ඔප්පු කිරීමට සහ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සඳහා සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන අතර එමඟින් ඔවුන්ට ස්ථිර බලපත්‍රය සඳහා ඉල්ලුම් කළ හැකිය. ස්ථිර බලපත්‍රය සමඟින්, විදුලි කාර්මිකයන්ට ගෘහස්ත විදුලි රැහැන් සැලසුම් කිරීම, වයර් කිරීම, පරීක්ෂා කිරීම, සවි කිරීම (ඇම්පියර් 30 සිඟනල් අදියර) සහ ලංවිම සහ ලොකෝ විසින් පිළිගත් විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා සහතිකයක් නිකුත් කළ හැකිය.

ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම පිළිබඳව විදුලි කාර්මිකයන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පළමු අදියර ලෙස දිස්ත්‍රික්ක 10ක් ආවරණය වන පරිදි 2019 වසරේ ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කළේය.

දෙවන අදියරේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2020 දී වසරේ මඩකලපුව, යාපනය, පුත්තලම, වව්නියාව, කිලිනොච්චිය, කුරුණෑගල, මන්නාරම, මුලතිව්, රත්නපුර, කෑගල්ල සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී.







ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන

විදුලි ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම පිළිබඳව සියලුම පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් චර්යානුගතව සිදුකරනු ලබන රාජකාරියකි. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේදී දිවයින පුරා සිටින කුඩා කණ්ඩායමේ විදුලි කාර්මිකයින් සහ පාරිභෝගිකයින් ඉලක්ක කර ගනිමින්, අවශ්‍ය සියලු තොරතුරු පත්‍රිකා මගින් බෙදාහරිමින් සහ ඔවුන් විසින් එම වැඩසටහන්වලදී මතු කරන ලද ගැටළු සඳහා සෘජු විසඳුම් ලබා දෙමින් වැඩසටහන් 09ක් සෘජුවම පවත්වන ලදි.

තොරතුරු බෙදාහැරීම

2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාර්ශ්වකරුවන්ට වැදගත් වන විවිධ විෂයයන් පිළිබඳ මාධ්‍ය නිවේදන 07ක් නිකුත් කරන ලද අතර, අවශ්‍යතාවයක් ඇති වූ විට සහ අවශ්‍ය විටෙක තොරතුරු බෙදා හරින ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එහි වාර්ෂික වාර්තාව 2019, කාර්ය සැලැස්ම 2020, ලිහිසි තෙල් වෙළෙඳපොල ප්‍රගතිය, උත්පාදන දත්ත, තොරතුරු අයිතිය පිළිබඳ වාර්ෂික වාර්තාව 2020, මහ බැංකුව වෙත වාර්තාව යනාදිය ද නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ද තොරතුරු ඉල්ලීම් 20 කට වැඩි ප්‍රමාණයක් ලැබී ඇති අතර, සියලුම ඉල්ලීම් සඳහා පහසුකම් සලසා ඇත.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා එහි කාර්ය මණ්ඩලය

අපගේ සේවකයින් අපගේ විශාලතම ශක්තියයි

අප වටා ඇති වෙනස්වන ලෝකය අපගේ උපාය මාර්ගය මත ලබා දීමට අපට අවශ්‍ය නිපුණතා ආකර්ෂණය කර රඳවා ගැනීමට වග බලා ගැනීම සඳහා අප මත ඉහළ ඉල්ලුමක් ඇති කරයි. විශිෂ්ට සේවක අත්දැකීමක් ගොඩනැගීම, කුතුහලය මත පදනම් වූ ඉගෙනුම් සංස්කෘතියක් දිරිමත් කිරීම, විවිධත්වය සහ ඇතුළත් කිරීම අපගේ සාරධර්මවල අනිවාර්ය කොටස් ලෙස තිබීම සහ සදාචාරාත්මක පෙරගමන්කරුවෙකු වීම සමීකරණයේ වැදගත් කොටස් බව අපි විශ්වාස කරමු. එබැවින් 2020 දී, විශේෂයෙන් කොවිඩ් වසංගතය පවතින කාලය තුළ බහුවිධ ප්‍රවේශයන් හරහා සංවිධානයේ ඉගෙනීමේ සහ හුවමාරු කිරීමේ දැනුම් සංස්කෘතියට සහාය වීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වැඩි අවස්ථා නිර්මාණය කරන ලදී.



මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හරහා මාසික ක්‍රියාකාරකම් ප්‍රගති අධීක්ෂණ මොඩියුලය සංවර්ධනය කිරීම

පුද්ගල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම සහ පරිශීලක-හිතකාමී පද්ධතියක් නොමැතිකම අද දවසේ කටයුතුවල ප්‍රධාන බාධාවක් වී ඇති අතර, එහිදී සේවකයින්ට ප්‍රගති නියාමනය, අයවැය බෙදා හැරීම් නියාමනය යනාදි ලෙස වාර්තා කිහිපයක් නැවත නැවත කියවීමට සිදු වේ. එබැවින්, පුනරාවර්තී සේවක වැඩ අඩු කිරීම මගින් කාලය ඉතිරි කර ගැනීම සඳහා යම් දෙනලද වේලාවක තොරතුරු වෙත පහසු ප්‍රවේශයක් ලබා දීමෙන් සේවකයින්ට වාර්තා ඇති කිරීමට හැකි පද්ධතියක් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කර ඇත. 2020 දී, ශක්‍යතා අධ්‍යයනය සහ පද්ධති සිතියම්කරණය අවසන් කරන ලදී.

නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව සියලුම සේවකයින්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා HRIS හි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පරිණාමය කිරීම සඳහා වසුහගත ධාරිතා සංවර්ධන මැදිහත්වීම් සංවර්ධනය කිරීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ට අනුකූලව සේවක නිපුණතා නියාමනය කිරීම සහ අදාළ ආකෘති ඇතුළුව පශ්චාත් පුහුණු ඵලදායිතාව ඇගයීම සඳහා සහ ක්‍රමානුකූල ක්‍රියාවලියක් සංවර්ධනය කිරීමට සහ ඒ අනුව සේවකයින්ගේ පශ්චාත් පුහුණු ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථිර නියාමන පද්ධතියක් මගින් පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සැලසුම් කර ඇත. 2020 දී, නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ට අනුකූලව සේවක නිපුණතා පිළිබඳ නිසි නියාමන යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සහතික කිරීම සඳහා මූලික ශක්‍යතා පරීක්ෂාව සහ වෙනස් කිරීම් සිදු කරන ලදී.

අංශයේ සාමාන්‍ය ගෙවීම් පද්ධතිය විධිමත් කිරීම

අංශයට අදාළ ගෙවීම්වල සැබෑ වියදම් තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ප්‍රවේශය වැඩි කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සැලසුම් කළේය. තුන්වන පාර්ශ්වයකින් (මුදල් අංශය) එක්රැස් කිරීමට අමතර කාලයක්

ගතවන බැවින් මෙම දත්ත ලබාගත නොහැකිවීම ප්‍රාදේශීය තීරණ ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද කරයි. ඒ අනුව, 2020 දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අංශයේ සාමාන්‍ය ගෙවීම් ක්‍රමය විධිමත් කරන ලදී.

ආයතනික සංවර්ධනය සහ සියලුම කාර්ය මණ්ඩලයේ වෘත්තීය වර්ධනය

ඵලදායී වර්ධනය සහ පැවැත්ම පිණිස අපගේ මානව ප්‍රාග්ධනය ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රවර්ධන මාර්ග ලබා දීම තුළින් සේවකයන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහා කාර්යයන්හී අවශ්‍යතා, කාර්යයන් සමඟ ව්‍යුහය පෙළගැස්වීම, ආයතනික ව්‍යුහාත්මක අවශ්‍යතා සහයවන අකාකරය පිළිබඳව මිනිස් බල අධ්‍යයනයක් පැවැත්වීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සැලසුම් කර ඇත. ඒ අනුව, එක් එක් විධායක කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නිපුණතා සහ සංශෝධිත කෙටුම්පත් සංවිධාන ව්‍යුහයට අනුව අනුප්‍රාප්තික සැලසුම් ලුහුබැඳීමේ පත්‍රිකාව සකස් කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සම්පූර්ණ කරන ලදී.



2021 සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සැලැස්ම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිය ජල සේවා සහ බනිජ තෙල් කර්මාන්තවල අවශ්‍යතා සහ ඉල්ලීම් සපුරාලීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරකම් තක්සේරු කර සැලසුම් කරයි.

රටේ සහ ආයතනයේ ඉලක්කණී නිමැවුම් සහ ඉල්ලීම් සපුරාලීම සඳහා පහළ සිට ඉහළ ප්‍රවේශයක් තුළ ක්‍රියාකාරකම් කෙටුම්පත් කර ඇත.

සෑම වසරකම එක් එක් ඉලක්කයේ වත්මන් තත්ත්වය සහ අපේක්ෂිත තත්ත්වය අතර පරතරය ඇගයීමට ලක් කර නියමිත ඉලක්ක අත්කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් හඳුනා ගනී.

සමහර ක්‍රියාකාරකම් වසරකට වඩා වැඩි කාලයක් පවතින අතර සමහර ක්‍රියාකාරකම් වසරක් ඇතුළත අවසන් කළ හැකිය.

ක්‍රියාකාරකම් විදුලි කර්මාන්තය බනිජ තෙල් කර්මාන්තය ජල සේවා කර්මාන්තය සහ සාමාන්‍ය වැඩ යන ප්‍රතිඵල හතරකට වර්ග කර ඇත.

2021 වර්ෂය සඳහා එක් එක් අංශයේ ක්‍රියාකාරකම් පහතින් හඳුනාගෙන ඇත¦

අංශ	ක්‍රියාකාරකම් යොමු අංකය	ක්‍රියාකාරකම් විස්තරය	අංශ	ප්‍රතිඵල අංක (1-4)
TEA	AP21/CP/TEA/01	විදුලිය අවසාන පරිශීලක ගාස්තු විදුලිය පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස්	විදුලිය	2
TEA	AP21/CP/TEA/02	තොග සේවා සම්බන්ධතා සැපයීම සහ සම්බන්ධතා වැඩි කිරීම සඳහා මාර්ගෝපදේශය	විදුලිය	2
TEA	AP21/CP/TEA/03	අවසර ලත් ගාස්තු ක්‍රමවේදය විදුලිය පිළිබඳ සමාලෝචනය	විදුලිය	2
TEA	AP21/CP/TEA/21	2019 වර්ෂය සඳහා විදුලිය බෙදා හැරීමේ විගණනය	විදුලිය	2
TEA	AP21/CP/TEA/22	සේවා නොලබන විදුලිය සඳහා බලශක්ති පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා පර්යේෂණ	විදුලිය	2
TEA	AP21/CP/TEA/23	අන්තර් ප්‍රභවයන් විදුලිය සඳහා ජාල ඒකාබද්ධ කිරීමේ සීමාව පිළිබඳ පර්යේෂණ	විදුලිය	2
TEA	AP21/CP/TEA/24	බෙදා හරින ලද ජනන විදුලිය සමඟ ජාල ක්‍රියාකාරිත්වය පිළිබඳ පර්යේෂණ	විදුලිය	2
TEA	AP21/CP/TEA/25	සම්ප්‍රේෂණ පද්ධති විදුලිය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය	විදුලිය	2
TEA	AP21/RU/TEA/31	2022 විදුලිය සඳහා ගොනු කර ඇති අවසර ලත් ගාස්තු සමාලෝචනය	විදුලිය	2
TEA	AP21/RU/TEA/32	කුඩා බෙදාහරින්නාගේ ගාස්තු සමාලෝචනය විදුලිය	විදුලිය	2
TEA	AP21/RU/TEA/33	තොග සැපයුම් ගාස්තු, ඒකාකාර ජාතික ගාස්තු සහ අවසාන පරිශීලක ගාස්තු සමාලෝචනය විදුලිය	විදුලිය	2
TEA	AP21/RU/TEA/34	දත්ත සහ දත්ත විශ්ලේෂණය විදුලිය	විදුලිය	2

පර්යේෂණ			විදුලිය	1
COA	AP21/CP/COA/01	ඉඩම් විදුලිය අවහිර කිරීම සඳහා (වෙන්දේසි කරන ලද) විදුලි සම්බන්ධතාවය සැපයීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම	විදුලිය	1
COA	AP21/CP/COA/02	මාර්ග නිවාඩු ගැටළු විසඳීම සඳහා සංශෝධිත මාර්ග නිවාඩු මාර්ගෝපදේශය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දැනුවත්භාවය සහ අනුකූලතාව ශක්තිමත් කිරීම පිළිබඳ සංවාදය	විදුලිය	1
COA	AP21/CP/COA/03	NWSDB ජලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම	ජලය	not defined
COA	AP21/CP/COA/21	ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලියේ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම	විදුලිය	1
COA	AP21/CP/COA/22	පාරිභෝගික පැමිණිලි කාර්යක්ෂමව විසඳීම සඳහා නියාමන මෙවලම් (රෙගුලාසි, නීති සහ මාර්ගෝපදේශ) වලට අනුකූල වීම සහතික කිරීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සමඟ සංවාදයක් පවත්වන්න	විදුලිය	1
COA	AP21/CP/COA/23	ජල සේවා නියාමනය	ජලය	not defined
COA	AP21/CP/COA/24	පළාත් හතක (බස්නාහිර, වයඹ, සබරගමුව, මධ්‍යම, උතුර, නැගෙනහිර, ඌව) විදුලි පාරිභෝගික පැමිණිලි විසඳීමට ජංගම සේවාවක්	විදුලිය	1
COA	AP21/RU/COA/31	පාරිභෝගික දුක්ගැනවිලි සඳහා බලපත්‍රලාභී උපදෙස් අදාළ නීති සහ මාර්ගෝපදේශවලට අනුකූලව පහසුකම් සැලසීම	විදුලිය	1
COA	AP21/RU/COA/32	විදුලිය (ආරවුල් විසඳීම) රීතිවලට අනුකූලව ආරවුල් විසඳීම	විදුලිය	1
COA	AP21/RU/COA/33	පාරිභෝගික උපදේශක කමිටුව (CCC) සම්බන්ධීකරණ	විදුලිය	1
COA	AP21/RU/COA/34	ලංකා විදුලි සමාගම පුද්ගලික සමාගමේ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම	විදුලිය	1
COA	AP21/RU/COA/35	දත්ත සහ දත්ත විශ්ලේෂණය	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/01	2022-41 විදුලිය අවම පිරිවැය දිගු කාලීන ජනන පුළුල් කිරීමේ සැලැස්ම සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/02	නිදහස් කරන ලද පාර්ශ්වයන්ගේ නියාමන රාමුව නැවත බැලීම සහ සංශෝධනය කිරීම පිළිබඳ උපදේශනය (විදුලිය ජනනය කිරීමට/බෙදාහැරීමට සහ සැපයීමට බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස්)	විදුලිය	1

LIC	AP/2021/LIC/CP/21	නව උත්පාදන බලාගාර යෝජනා (AP20/CP/LIC/0) විදුලිය අනුමත කිරීමේදී අවම පිරිවැය මූලධර්මයට අනුකූල වීම පිළිබඳව සැහීමකට පත්වන බව තීරණය කිරීමට කොමිෂන් සභාව සඳහා වන නිර්ණායක තීරණය කිරීම සඳහා මාර්ගෝපදේශ	විදුලිය	2
LIC	AP/2021/LIC/CP/22	දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම (AP20/CP/LIC/03) විදුලිය සමාලෝචනය සහ අනුමැතිය	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/23	ආපදා කළමනාකරණ සැලසුම්- විදුලි අංශය (AP20/CP/LIC/04) විදුලිය	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/24 (20/5)	Lanka Electricity Company Pvt Ltd හි විදුලිය (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති නියාමනය (බලය ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය) ක්‍රියාත්මක කිරීම	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/25(20/6)	ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබලයේ (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති නියාමනය (බලයේ ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය) ක්‍රියාත්මක කිරීම	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/26(20/7)	මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රමිති සකස් කිරීම සහ ආයතනික මෙහෙයුම් ව්‍යුහය විදුලිය පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස්	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/27(20/8)	ශ්‍රී ලංකා බණ්ඩ තෙල් තුළ භාවිත කළ ලිහිසි තෙල් එකතු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම	බනිජ තෙල්	
LIC	AP/2021/LIC/CP/28(20/9)	විදුලිය බෙදා හැරීමේ කේතය සංශෝධනය කිරීම	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/31	ජනන සැලැස්ම විදුලිය අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා නව බලාගාර යෝජනා සමාලෝචනය කිරීම	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/32	ජනනය සහ සම්ප්‍රේෂණ කාර්ය සාධන වාර්තා	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/33	කෙටි කාලීන බලශක්ති ආරක්ෂණ විදුලිය පිළිබඳ වාර්තාව	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/34	සම්ප්‍රේෂණ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි විදුලි බලය ක්‍රියාත්මක කිරීම	විදුලිය	1
LIC	AP2021/CP/LIC/35	බලපත්‍ර අයදුම්පත් සහ නිදහස් කිරීම් (නව යෙදුම්, වෙනස් කිරීම්, දිගු කිරීම්) ඇගයීම සහ බලපත්‍ර ප්‍රදානය	විදුලිය	1
LIC	AP2021/CP/LIC/36	DCERP රැස්වීම් විදුලිබල මණ්ඩලයේදී ගත් තීරණය ක්‍රියාත්මක කිරීම	විදුලිය	1

LIC	AP2021/CP/LIC/37	ලිහිසි තෙල් වෙළඳපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම්	බනිජ තෙල්	
LIC	AP2021/CP/LIC/38	LISS පරිපාලන	විදුලිය	1
LIC	AP2021/CP/LIC/39	දත්ත සහ දත්ත විශ්ලේෂණය	විදුලිය	1
LIC	AP/2021/LIC/CP/40	Dispatch Analysis වාර්තා	විදුලිය	2
INS	AP20/CP/INS/01	පාරිභෝගිකයින් විදුලිය අත්විඳින වෝල්ටීයතා උච්චාවචන ගැටළු ආවරණය කිරීම සඳහා රෙගුලාසි යාවත්කාලීන කිරීම	විදුලිය	1,3
INS	AP20/CP/INS/02	පුනර්ජනනීය බලාගාර (බලපත්‍රලාභීන්) විදුලිබල නියැදියක පරීක්ෂණ පැවැත්වීම	විදුලිය	1,3
INS	AP20/CP/INS/03	විදුලිය බෙදාහැරීම සහ සැපයීම සඳහා බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති පාර්ශ්වයන්ගේ පරිශ්‍රවල පරීක්ෂණ පැවැත්වීම	විදුලිය	1,3
INS	AP20/CP/INS/04	පොදු මහජන විදුලිය සඳහා සම්ප්‍රේෂණ මාර්ග කොරිඩෝව පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශ්‍යතාව සැපයීම	විදුලිය	1,3
INS	AP20/CP/INS/05	විදුලිය හරහා ආරක්ෂිත නියාමනය සමග අනුකූල වීම	විදුලිය	3
INS	AP20/CP/INS/06	ජාතික වැදගත් ගොඩනැගිලිවල විදුලි ගිනි උවදුරු අවම කිරීම සඳහා මාර්ග විශ්ලේෂණය කිරීම	විදුලිය	3
INS	AP20/RU/INS/31	විදුලි ආරක්ෂණ විදුලියට අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම	විදුලිය	3
INS	AP20/RU/INS/32	මහජන දැනුවත් කිරීමේ වැඩසටහන	විදුලිය	3
INS	AP20/RU/INS/33	බලපත්‍රලාභීන්ගේ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පද්ධතිය හරහා නීතිවිරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිතා කරන පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට සම්බාධක නිර්දේශ කිරීම	විදුලිය	1,3
INS	AP20/RU/INS/34	පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත හෝ විදුලි කොමිෂන් සභාවේ නියෝග මත පරීක්ෂණ පැවැත්වීම, විදුලි රැහැන් පරීක්ෂා කිරීම හෝ විදුලිය සැපයීම	විදුලිය	1,3
INS	AP20/RU/INS/35	විදුලි කාර්මික බලපත්‍ර රාමුව ක්‍රියාත්මක කිරීම, ජලනල කාර්මික බලපත්‍ර, සොකට් සහ ප්ලග් ප්‍රමිතිකරණය සහ ආරක්ෂාව සහ තාක්ෂණික කළමනාකරණ සැලැස්ම, සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය (රෝහල්) විදුලිය සකස් කිරීම	විදුලිය	1,3
INS	AP20/RU/INS/36	විදුලි සැර විශ්ලේෂණ වාර්තා	විදුලිය	3

FIN	AP21/CP/FIN/01	අවශ්‍ය මූල්‍ය පාලනය සමඟ ක්‍රියාවලි විධිමත් කිරීම සහ මූල්‍ය අත්පොත යාවත්කාලීන කිරීම		
FIN	AP21/CP/FIN/02	ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම		
FIN	AP21/CP/FIN/03	මිනින්දෝරු මණ්ඩලය සහ භාවිතයට නුසුදුසු භාණ්ඩ බැහැර කිරීම		
FIN	AP21/RU/FIN/31	විවිධ ගිණුම්කරණ මොඩියුලවල සහ ගිණුම්කරණ තොරතුරු පද්ධතියේ සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම		
FIN	AP21/RU/FIN/32	මූල්‍ය අධීක්ෂණය සහ නියාමන අනුකූලතාවය		
FIN	AP21/RU/FIN/33	සියලුම ලැබීම් සහ ගෙවීම් නිරීක්ෂණය කිරීම		
HR	AP21/HR/CP/01	කොමිෂන් සභා වෙබ් අඩවියට සම්බන්ධ සුදුසු බඳවා ගැනීමේ අතුරු මුහුණතක් සංවර්ධනය කිරීම		
HR	AP21/HR/CP/02	සියලුම රැකියා විස්තර සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සහ රැකියා විස්තර අත්පොතක් සකස් කිරීම		
HR	AP21/HR/CP/03	ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති සඳහා ඕ සහතිකය ලබා ගැනීම		
HR	AP21/HR/CP/04	බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම		
HR	AP20/HR/CP/21	මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හරහා මාසික ක්‍රියාකාරකම් ප්‍රගති අධීක්ෂණ මොඩියුලය සංවර්ධනය කිරීම		
HR	AP20/HR/CP/22	02/2018 නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව සියලුම සේවකයින්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා HRIS හි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පරිණාමය කිරීම සඳහා ව්‍යුහගත ධාරිතා සංවර්ධන මැදිහත්වීම් සංවර්ධනය කිරීම.		
HR	AP20/HR/CP/23	කොට්ඨාසයේ සාමාන්‍ය ගෙවීම් පද්ධතිය විධිමත් කරන්න		

HR	AP20/HR/CP/24	සියලුම කාර්ය මණ්ඩලයේ ආයතනික සංවර්ධනය සහ වෘත්තීය වර්ධනය - අනුප්‍රාප්තික සැලසුම්		
HR	AP21/HR/RU/31	ධාරිතා ගොඩනැගීම සහ පුහුණුව		
HR	AP21/HR/RU/32	සේවක සහභාගීත්වය සහ සුභසාධනය		
HR	AP21/HR/RU/33	අනෙකුත් සාමාන්‍ය පරිපාලන කටයුතු		
CCO	AP21/CP/CCO/01	දැනුවත් කිරීමේ ව්‍යාපාරය	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/CP/CCO/02	යාවත්කාලීන කරන ලද ලිහිසි තෙල් ප්‍රමිතීන් සහ බනිජ තෙල් අමාත්‍යාංශය, CAA සහ ශ්‍රී ලංකා රේගු පෙට්‍රෝලියම් සමඟ නව වෙළෙඳපොළ ක්‍රීඩකයින් පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාරය	බනිජ තෙල්	0
CCO	AP21/CP/CCO/03	ක්‍රියාකාරකම් මත පදනම් වූ සවිස්තරාත්මක සන්නිවේදන සැලැස්ම 2021	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/CP/CCO/21	පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (බාලදක්ෂයින් සඳහා ආරක්ෂක මොඩියුලය හඳුන්වාදීම සහ පාසල් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් පුහුණු කිරීම)	විදුලිය	3
CCO	AP21/CP/CCO/22	ශ්‍රී ලංකාවේ විදුලිය/බනිජ තෙල්/ජල නියාමකයින් සඳහා දැනුම වේදිකාව	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/CP/CCO/23	විදුලි කර්මාන්තය ආශ්‍රිත ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපාරය - පර්යේෂණ සංසදය)	විදුලිය	3
CCO	AP21/CP/CCO/24	ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී නිවාස සඳහා බලශක්ති කාර්යක්ෂම නිවාස ආකෘතිය හඳුන්වාදීම, දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය - මොරටුව විශ්ව විද්‍යාලය සමඟ විදුලිය පිළිබඳ පර්යේෂණ ප්‍රදාන සහ දැනුම බෙදාගැනීමේ ව්‍යාපෘතිය	විදුලිය	4
CCO	AP21/RU/CCO/31	ව්‍යවස්ථාපිත දැන්වීම් පළ කිරීම	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/RU/CCO/32	ජන මාධ්‍ය, ආයතනික වාර්තා, මාධ්‍ය සම්බන්ධතා සහ අධීක්ෂණ -දෙමළ	විදුලිය/බනිජ තෙල්/ජලය	3
	AP21/RU/CCO/33	ජන මාධ්‍ය, ආයතනික වාර්තා, මාධ්‍ය සම්බන්ධතා සහ අධීක්ෂණ සඳහා අන්තර්ගත සංවර්ධනය - සිංහල	විදුලිය/බනිජ තෙල්/ජලය	3

CCO	AP21/RU/CCO/34	ජන මාධ්‍ය, ආයතනික වාර්තා, මාධ්‍ය සම්බන්ධතා සහ අධීක්ෂණ -ඉංග්‍රීසි	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/RU/CCO/35	ඩිජිටල් දෘශ්‍යතාව සහ පොදු සන්නිවේදනය වැඩි කිරීම	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/RU/CCO/36	ජන මාධ්‍ය සහ ආයතනික වාර්තා සඳහා අන්තර්ගත සංවර්ධනය	විදුලිය/බනිජ තෙල්/ජලය	3
CCO	AP21/RU/CCO/37	RTI කළමනාකරණය	විදුලිය/බනිජ තෙල්/ජලය	3
RA	AP21/CP/RA/01	බනිජ තෙල් අංශයේ උපයෝගිතා සඳහා ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම	විදුලිය/බනිජ තෙල්/ජලය	1
RA	AP21/CP/RA/02	ඉන්ධන පිරවුම්හල් සඳහා ප්‍රමිති සකස් කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/03	නියාමන අත්පොත යාවත්කාලීන කිරීම	විදුලිය/බනිජ තෙල්/ජලය	
RA	AP21/CP/RA/21	මධ්‍ය ප්‍රවාහයේ සහ පහළ ප්‍රවාහයේ ස්වභාවික වායු වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා රාමුවක් සකස් කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/22	ලිහිසි තෙල් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සමාලෝචනය කර යාවත්කාලීන කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/23	සැපයුම් සේවා කේතය යාවත්කාලීන කිරීම සහ විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ප්‍රකාශය	විදුලිය	1
RA	AP21/CP/RA/24	තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා ආනයනික සහ දේශීයව මිශ්‍ර කරන ලද ලිහිසි තෙල්වල තීරුබදු ව්‍යුහය පිළිබඳව රජයට උපදෙස් සම්පාදනය කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/25	භූමිතෙල් සමඟ පෙට්‍රල් සහ ඩීසල් මිශ්‍ර කිරීම හඳුනාගැනීම සඳහා ක්‍රියා පටිපාටිය සකස් කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/26	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රෙගුව විසින් ලිහිසි තෙල් අනිවාර්යයෙන් ආනයනය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය සකස් කිරීම.	බනිජ තෙල්	

RA	AP21/CP/RA/27	නියාමන බලපෑම් විශ්ලේෂණය සඳහා මාර්ගෝපදේශ (Ex-Ante)	Electricity/ Petroleum/ Water	
RA	AP21/CP/RA/28	පෙට්‍රෝලියම් ඉන්ධන බෙදා හැරීමේ පොම්ප සඳහා ප්‍රමිතීන් සහ අධීක්ෂණය සඳහා යාන්ත්‍රණය සකස් කිරීම	බනිජ තෙල්	
RA	AP21/CP/RA/29	බනිජ තෙල් ඉන්ධන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සමාලෝචනය කර යාවත්කාලීන කරන්න	බනිජ තෙල්	
RA	AP21/RU/RA/31	ලිහිසි තෙල් සහ ග්‍රීස් වෙළඳපොළ ජයාමාත්‍ර නියාමනය කරයි	බනිජ තෙල්	
RA	AP21/RU/RA/32	පහළ පෙට්‍රෝලියම් කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් විෂය අමාත්‍යාංශයට උපදෙස් සහ සහාය ලබා දීම	බනිජ තෙල්	
EER	AP21/CP/EER/01	පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් විදුලිය මගින් බලශක්ති උත්පාදනය සඳහා බාහිර පිරිවැය ඇස්තමේන්තු කිරීම	විදුලිය	2
EER	AP20/CP/EER/21	උපයෝගිතා මත ධාවනය වන ෂීඑ වැඩසටහන් විදුලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය	විදුලිය	2
EER	AP20/CP/EER/22	ඉල්ලුම ප්‍රතිචාර අවස්ථා විදුලිය පිළිබඳ තාක්ෂණික-ආර්ථික ශක්‍යතා අධ්‍යයනය	විදුලිය	2
EER	AP20/CP/EER/23	පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් විදුලියෙන් 80% බලශක්තිය ලබා ගැනීම පිළිබඳ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනය	විදුලිය	2
EER	AP21/RU/EER/31	විදුලි බලාගාරවල පාරිසරික කාර්ය සාධනය දත්ත රැස් කිරීම සහ බෙදා හැරීම	විදුලිය	4
EER	AP21/RU/EER/32	පුනර්ජනනීය බලශක්ති උත්පාදන විදුලිය පිළිබඳ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය	විදුලිය	2
EER	AP21/RU/EER/33	ලක්විජය බලාගාරයේ පාරිසරික කාර්ය සාධනය සහ අවම කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම නිරීක්ෂණය කිරීම	විදුලිය	4
IT	AP21/CP/IT/01	LISS ප්‍රතිසංස්කරණය කිරීම		
IT	AP21/CP/IT/02	තාක්ෂණික තොරතුරු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම + ජංගම යෙදුම		
IT	AP21/CP/IT/03	ඩිජිටල් මාධ්‍ය වේදිකාවක් ක්‍රියාත්මක කිරීම		
IT	AP20/CP/IT/02 (AP21/CP/IT/21)	සිදුවීම් වාර්තා කිරීමේ පද්ධතිය (AP20/CP/IT/02)		

IT	AP20/CP/IT/03 (AP21/CP/IT/22)	බලපත්‍ර කළමනාකරණ පද්ධතිය (AP20/CP/IT/03)		
IT	AP20/CP/IT/04 (AP21/CP/IT/23)	මානව සම්පත් සහ මූල්‍ය පද්ධති වැඩිදියුණු කිරීම (AP20CPIT$04)		
IT	AP21/RU/IT/31	පවතින ව්‍යාපාරික යෙදුම් වැඩිදියුණු කිරීම		
IT	AP21/RU/IT/32	දත්ත විශ්ලේෂණය		
IT	AP21/RU/IT/33	ඉන්ට්‍රානෙට් / අමතර ජාලයක් ක්‍රියාත්මක කිරීම		
IT	AP21/RU/IT/34	ප්‍රසම්පාදන කාර්ය ප්‍රවාහය ස්වයංක්‍රීය කිරීම		
IT	AP21/RU/IT/35	නිපදවීමේ සැලසුම් මෘදුකාංග පද්ධතියක් මූලාකෘති කිරීම		
IT	AP21/RU/IT/36	යටිතල පහසුකම් සංවර්ධනය		
IT	AP21/RU/IT/37	කාර්යාල ස්වයංක්‍රීයකරණය		
IT	AP21/RU/IT/38	BCP/DR + ආරක්ෂාව		
IT	AP21/RU/IT/39	නඩත්තු		
IT	AP21/RU/IT/40	කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම සඳහා විසඳුම		
		2022 වසර සඳහා ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම		

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඒපීඩී/ඔ/පියුඔ/2020/එෆ්ඒ/04 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජනවාරි 21 දින

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීපීඩී/සී/පීයූසී/2020/එෆ්ඒ/04 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජනවාරි 21 දින

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ I හා II ඡේද	මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය හා වැටුප් ව්‍යුහය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සමඟ මුදල් ඇමතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර අනුමත කරගත යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම කටයුතු සිදු නොකර පහත පරිදි වියදම් කර තිබුණි.

(i) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සිය ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා වර්ග 10 ක් යටතේ එකතුව රු.42,795,220 ක් ගෙවා තිබුණි.

(ii) සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා මාසිකව රු.40,000 ක් බැගින්ද, කළමනාකරණ තනතුර සඳහා මාසිකව රු. 5,000 ක් බැගින්ද, රියදුරු තනතුර සඳහා මාසිකව රු.2,500 ක් බැගින්ද, ගමන් වියදම් ලෙස ගෙවීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටි සංග්‍රහය අනුව විධිවිධාන සලසා තිබුණි. එම විධිවිධානවලට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන එකතුව රු.8,511,832 ක් ගෙවා තිබුණි.

(iii) කොමිෂන් සභාවේ සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිමය රු. මිලියන 5 ක සහ ආපසු ගෙවීමේ කාලය අවුරුදු 5 යටත්ව වාහන සඳහා ණය යෝජනා ක්‍රමයක් අනුමත කර තිබුණි. එම යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව බැංකුවකින් අයකර ගනු ලබන පොලී ප්‍රතිශතයෙන් සියයට 4.25 ක් සේවකයාගෙන් අයකර ගනු ලබන අතර බැංකුව අයකරන පොලී ප්‍රතිශතය හා සියයට 4.25 අතර වෙනස කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකු විසින් ලබාගෙන තිබූ වාහන ණය වෙනුවෙන් පොලිය ලෙස රු.187,013 කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි.

(iv) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 ක උපරිම සීමාව හා අවුරුදු 15 ක කාල සීමාවට යටත්ව නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය 2018 අගෝස්තු 18 දිනැති අංක 220 දරන කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සේවකයන් විසින් රජය සතු බැංකුවකින් ලබා ගන්නා ලද නිවාස හා දේපල ණය සඳහා අයකරනු ලබන පොලියෙන් සියයට 4.25 ක් සේවකයා විසින් දැරිය යුතු අතර, බැංකුව අයකරනු ලබන පොලිය හා සියයට 4.25 ක් අතර වෙනස කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කරනු ලබයි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 17 දෙනෙකු විසින් ලබා ගන්නා ලද නිවාස හා දේපල ණය වෙනුවෙන් පොලිය ලෙස එකතුව රු.2,395,761 ක් කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි.

2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED/1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	වක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රවාහන දීමනා හිමි නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව ලෙස රු.50,000 ක මාසික දීමනාවක් ලබාදිය හැකි වුවත්, කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය යටතේ එම වක්‍රලේඛ විධිවිධාන අභිබවා ප්‍රවාහන දීමනා ලෙස රු.60,000 ක් හා රියදුරු දීමනා ලෙස රු.20,000 ක් බැගින් ගෙවීම් කර තිබුණි. එම විධිවිධාන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන එකතුව රු.13,140,000 ක් ගෙවා තිබුණි.
2015 මැයි 25 දිනැති අංක PED - 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය 3.1 ඡේදය	රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු ඉන්ධන ලීටර් ප්‍රමාණයට අදාල වට්ටනාකම ඉක්මවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මඟින් විදුලිය, ඛනිජතෙල් හා	විදුලිය, ඛනිජතෙල් හා ජලය යන ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත

ජලය නියාමනය කිරීම.	නියාමනය කිරීම සඳහා 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට බලය ලැබී තිබුණි. බනිජතෙල් කර්මාන්තය හා ජලසම්පාදන හා ජලාපවාහන කර්මාන්තය අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2020 දෙසැම්බර් 31 දින වන විට වාර්ෂික නියාමන ගාස්තු වශයෙන් එකතුව රු.82,176,866 ක් ලැබිය යුතුව පැවතිණි. 2021 ජූනි 30 දින වන විට ඉන් රු.726,954 ක් පමණක් අදාළ ආයතන වෙතින් ලැබී තිබුණි. 2021 ජූනි 30 දින වන විට රු. 81,449,912 ක් වූ හිඟ හිටි නියාමන ගාස්තු නිරවුල් කර නොතිබුණි.

(ආ) ආදායම් විශ්ලේෂණය

වාර්ෂික නියාමන ගාස්තු (Annual Regulatory Levy)

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වන වගන්තියට අනුව, වාර්ෂික නියාමන බද්දක් /ගාස්තුවක් පැනවීමට කොමිෂන් සභාවට බලය ලබා දී තිබුණි. එය, සෑම වර්ෂයකම ජූනි 30 දින හෝ ඊට පෙර සෑම බලපත්‍රයකින්ම අය කරගත යුතුව තිබුණි. 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික නියාමන ගාස්තු බලපත්‍රලාභීන් 82 දෙනෙකුගෙන් නියමිත දින හෝ ඊට පෙර අය කර ගෙන නොතිබුණි. එය වාර්ෂික නියාමන ගාස්තු අය කළ යුතු බලපත්‍රලාභීන්ගෙන් සියයට 44 ක් නියෝජනයක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ

මූල්‍ය ප්‍රකාශන - 2020 වර්ෂය

අන්තර්ගතය

	Page
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	64
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	66
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	66
සම කොටස් වෙනස්කිරීම පිළිබඳ ප්‍රකාශනය	67
ගිණුම්කරණ ප්‍රතිපත්ති	69-72
දේපල පිරියත සහ උපකරණ	73
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	79

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2019 දෙසැම්බර් 31 දිනට

	Notes	2020 Rs	2019 Rs
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	31,917,717	43,367,460
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	1.1	-	5,330,495
ආපදා ණය		6,263,793	2,968,831
මුළු ජංගම නොවන වත්කම්		**38,181,511**	**51,666,786**
ජංගම වත්කම්			
ආයෝජන	2	514,868,339	288,549,964
භාණ්ඩ ලේඛන	3	76,303	205,783
ලැබිය යුතු දෑ	4	167,222,062	273,918,132
තැන්පතු, අත්තිකාරම් හා පෙර ගෙවුම්	5	7,739,100	8,950,207
මුදල් හා මුදල් සමාන දෑ		**4,460,627**	**1,192,028**
මුළු ජංගම වත්කම්		**694,366,431**	**572,816,114**
මුළු වත්කම්		**732,547,942**	**624,482,901**
අරමුදල් සහ වගකීම්			
අරමුදල්			
සමුච්චිත අරමුදල	6	675,027,631	528,251,661
ප්‍රත්‍යගණන සංචිත		24,849,786	24,849,786
		699,877,417	**553,101,447**

ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	8	16,973,374	14,888,341
මුළු ජංගම නොවන වගකීම්		**16,973,374**	**14,888,341**

ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	**7**	14,897,151	44,265,513
විගණකාධිපතිවරයාගේ ගාස්තු	**9**	800,000	1,627,600
සුරැකුම් තැන්පතුව- ලං.වි.ම.		-	10,600,000
මුළු ජංගම වගකීම්		**15,697,151**	**56,493,113**
මුළු වගකීම්		**732,547,942**	**624,482,901**

05 සිට 12 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙකී මූල්‍ය ප්‍රකාශන සකසා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා සාමාජිකයින් ගේ වගකීම් වේ

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්,

ජනක රත්නායක මහතා
සභාපති

කොමිෂන් සභා සාමාජික

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්

තිලණ රණසිංහ
අධ්‍යක්ෂ - මූල්‍ය

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

		2020	2019
	Notes	Rs	Rs
ආදායම			
විවල්‍ය ලියාපදිංචි ගාස්තුව	10	141,145,406	149,455,507
වාර්ෂික නියාමන ගාස්තු	11	189,818,981	185,302,257
බලපත් ඉල්ලුම්පත්‍ර ගාස්තු	12	474,000	513,000
වෙනත් ආදායම	13	27,685,191	25,016,671
මුළු ආදායම		**359,123,578**	**360,287,435**
වියදම්			
පුද්ගලික පිරිවැය	14	113,800,954	112,163,568
උපදේශන සේවා		5,455,619	28,108,960
මෙහෙයුම් වියදම්	15	94,251,588	120,431,964
මූල්‍ය පිරිවැය	16	11,185	11,891
මුළු වියදම		**213,519,345**	**260,716,383**
වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය		**145,604,233**	**99,571,052**
අනිකුත් විස්තීරණ ආදායම			
ප්‍රති ඇගයුම්කරණ ලැබීම්		-	-
තථ්‍ය ලාභය/අලාභය		1,171,741	(212,530)
වර්ෂය සඳහා මුළු අතිරික්තය		**146,775,974**	**99,358,522**

05 සිට 12 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අනිවාර්ය කොටසක් වේ

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	සමුච්චිත අරමුදල	ප්‍රති ඇගයුම්කරණ සංචිත	එකතුව
2020 ජනවාරි 1 දිනට ශේෂය	528,251,661	24,849,786	553,101,447
ආදායම් ප්‍රකාශයේ අතිරික්තය	145,604,233	-	145,604,233
වෙනත් විස්තීර්ණ ආදායම්	1,171,741	-	1,171,741
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	675,027,631	24,849,786	699,877,417

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	2020	2019
	Rs	Rs
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ මුදල්		
වසරේ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	145,604,233	99,358,522
ගැලපුම් කළා		
ක්ෂයවීම්	19,631,935	21,399,947
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,414,485	3,325,435
ස්ථාවර වත්කම් බැහැරකිරීමෙන් ලද ආදායම	81,120	(93,569)
පෙර වර්ෂ කාල පරිච්ඡේදය සඳහා ගැලපීම්		(4,217,336)
පොලී ආදායම	(27,571,802)	(22,523,767)
	141,159,971	97,249,232
කාරක ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල වෙනස්වීම්		
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම)/අඩුවීම	129,481	214,198
තැන්පතුවල (වැඩිවීම)/අඩුවීම	(9,000)	(5,500)
ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම	104,072,005	(107,529,430)
ගෙවිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම	(40,768,596)	20,267,789
අත්තිකාරම්. පෙර ගෙවුම්වල (වැඩිවීම)/අඩුවීම	1,220,107	(2,459,164)
කාරක ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල ශුද්ධ වෙනස්වීම්	64,643,997	(89,512,107)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ/(භාවිතා වූ) මුදල්	205,803,968	7,737,126
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය		
ස්ථාවර වත්කම් බැහැරකිරීමෙන් ලැබුණු ආදායම	154,189	107,650
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(3,114,374)	(9,139,657)
ලද පොලිය	26,900,902	21,654,010
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්	50,000,000	77,000,000
පාරිතෝෂික ආදායමෙහි වැඩිවීම	(1,318,376)	(1,201,655)
ස්ථාවර තැන්පතු/භාණ්ඩාගාර බිල්පත් සහ ඇමතුම් තැන්පතුවල ආයෝජනය කළ	(275,000,000)	(97,000,000)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිත කෙරෙන) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(202,377,659)	(8,579,652)

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය		
පාරිතෝෂික ගෙවීම්	(157,710)	(1,453,313)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් (භාවිත කෙරෙන) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(157,710)	(1,453,313)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	1,192,028	3,275,337
වසර තුළශුද්ධ මූල්‍ය ප්‍රවාහය	3,268,599	(2,295,839)
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	4,460,627	979,498
මුදල් හා මුදල්වලට සමාන දෑ		
අතැති සහ බැංකුවෙහි ඇති මුදල්	4,460,627	1,192,028

සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

01 .සාමාන්‍ය

සංගත ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව ඇතැම් උපයෝගිතා කර්මාන්තයන් නියාමනය කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ස්ථාපනය කරන ලදී.

ඉහත ප්‍රතිපත්තියට අනුකූලව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත නීතිගත කිරීමත් සමගින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය නියාමනය කිරීමේ බලය පවරන ලදී.

02 .සකස් කිරීමේ පදනම

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ හා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතාවයනට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශනයන් සකසා ඇත.

2.2. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකසා ඇත. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩභාවයේ පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම සංගත ලෙසින් ක්‍රියාත්මක වේ

2.3 මූල්‍ය කාල පරිච්ඡේදය

කොමිෂන් සභාවේ මූල්‍ය කාල පරිච්ඡේදය ලිත් වර්ෂය වනු ඇත.

03. සන්සන්දනාත්මක තොරතුරු

අන් අයුරකින් ප්‍රකාශ කර ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින් යොදාගනු ලැබ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරේ යොදා ගන්නා ලද ඒවා හා අනුරූපී වේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුගත වනු පිණිස අවශ්‍ය තැන්හි පෙර වසරේ සංඛ්‍යා හා වාක්‍ය ඛණ්ඩ නැවත සකස් කර ඇත.

04. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සියළු වැදගත් සිදුවීම් සලකා බලන ලදුව මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්හි නිසි ගැලපීම් හා නිරාවරණයන් සිදුකර ඇත.

05. වත්කම් තක්සේරුකරණය හා ඒවාහි මිනුම්කරණ පදනම්

5.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පහත දී ඇති පරිදි පිරිවැය/අඩුකළ සමුච්චිත ක්ෂය වීම හෝ ප්‍රති ඇගයුම්කරණ ලෙස හෝ ප්‍රයෝජනවත් ආයුකාලය සංශෝධනය කරමින් සටහන් කෙරේ. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය වුකලි වත්කම් ඒවායෙහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස වැය වූ යම් වියදමක් වේනම් ඒවා ද සමගින් ඒවා මිල දී ගැනීමට හෝ ගොඩනැගීමට වැය වූ පිරිවැය වේ

මෝටර් වාහන හැරුණු විට අනෙක් සියලුම වත්කම්, එම වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වසනීයව මැනිය නොහැකි බැවින් පිරිවැය / අඩුකළ සමුච්චිත ක්ෂයවීම් වලින් වාර්තා වී තිබේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද කමිටුව විසින් 2018 දෙසැම්බර් 31 වන දින මෝටර් රථ නැවත තක්සේරු කරන ලද අතර වත්කම්වල ධාරණ වටිනාකම වැඩි කිරීම ප්‍රති ඇගයුම්කරණ සංචිතවලට බැර කර ඇත. සෑම වසර දෙකකට වරක්ම මෝටර් රථ නැවත තක්සේරු කිරීමට තීරණය විය.

තවමත් භාවිතයේ පවතින පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කිරීමට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ට අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනසක් ලෙස ක්ෂය වාර්තා කිරීමටත් තීරණය කරන ලදී.

5.2 ක්ෂයවීම්

දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත සරල මාර්ගික ක්ෂය වීම් ප්‍රතිපාදන ගණනය කෙරේ. ඒ අනුව, වත්කම්හි ක්ෂය වීම් අනුපාත පහත පරිදි වේ:

1.ගෘහභාණ්ඩ හා සවිකිරීම්	20%
2.පරිගණක හා කාර්යාලීය උපකරණ	
මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය / SAN සංචිත	25%
ඩෙස්ක්ටොප් පරිගණකය	25%
ලැප්ටොප් පරිගණක	25%
ජංගම දුරකථන	33 1/3%
අතේ ගෙනයා හැකි දෘඪ තැටිය/සර්වර් දෘඪ තැටිය	33 1/3%
බඹඩ ටේප් ධාවකය	33 1/3%
බඹඩ ටේප්	33 1/3%
යූ.පී.එස්.	50%
අනෙකුත්	20%
3.වාහන	20%
4.මෘදුකාංග	331/3%
5.කාර්යාලීය උපකරණ	20%

පවත්නා වර්ෂයේ දේපළල පිරියත හා උපකරණ මිලදී ගත් දින සිට ක්ෂය වීම් ගණනය අදාළ වේ.

ඒ ඒ මූල්‍ය වර්ෂය අවසානයේ දී අවශ්‍ය වේනම්ල වත්කම්හි ප්‍රයෝජනවත් ආයු කාලයල අවශේෂ අගයන් සහ ක්ෂය වීම් ක්‍රම ද සමාලෝචනය කොට ප්‍රති ඇගයුම්කරණය කරනු ලබයි.

5.3 සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

වර්ෂය තුළ දරන ලදුව වාර්තා කරනු ලබන දිනය වනවිට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම් කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් වශයෙන් පෙන්නුම් කෙරෙන අතරල වර්ෂය තුළ සම්පූර්ණ කොට භාවිතය සඳහා පවත්නා ප්‍රාග්ධන වත්කම් දේපළල පිරියත හා උපකරණ වෙත මාරු කෙරෙනු ඇත

06. භාණ්ඩ ලේඛන

වට්ටෝරු භාණ්ඩ අවම පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කෙරෙහ භාණ්ඩ ලේඛන වල පිරිවැය ළඟා වන්නේ ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත් කිරීම (FIFO) පදනම භාවිතා කරමිනි

07. ආයෝජන

කොමිෂන් සභාව වෙත ලැබෙන ප්‍රතිලාභ උපරිම කරනු පිණිස කොමිෂන් සභාව විසින් එහි අතිරික්ත ආදායම ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක් ලෙස ආයෝජනය කරනු ලබයි

08. ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තුගත ප්‍රමාණයන් අනුව ප්‍රකාශ කෙරෙහ අයභපත් හෝ සැක සහිත ණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු නොකෙරේ

9. අත්තිකාරම් හා පෙර ගෙවීම්

පෙරගෙවුම් ගිණුමට නිශ්චිත කාල සීමාව සඳහා සේවාවන් ලබා ගැනීම සඳහා විවිධ සැපයුම්කරුවන්ට ගෙවන වාරිකයෙන් කොටසක් සහ සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදයට අදාළ නොවන (නමුත් අනාගත කාල පරිච්ඡේදය සඳහා) ගෙවනු ලබන මුදල් අයත් වන අතර අත්තිකාරම් ගිණුමට ලබාගත් සහ 2020-12-31 දිනට පියවා නොමැති අත්තිකාරම් ඇතුළත් වේ

10. මුදල් හා මුදල් සමාන දේ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් හා මුදල් සමාන දේ බැංකුවේ හා අත රැඳි මුදල්වලින් සමන්විත වේ

11. විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

11.1 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාර, සේවකයෙකුගේ පාරිතෝෂික වගකීම ඉස්මතුවනුයේ කොමිෂන් සභාව තුළ ඔහු අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ පසුව පමණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 සමඟ සනාථ කිරීම සඳහා පාරිතෝෂික වගකීම් වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව ආයුගණක තක්සේරුව යොදාගන ඇත. ආයුගණක තක්සේරුව සිදු කරනු ලැබුවේ වෘත්තීය ආයුගණක තක්සේරුකරුවන් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (සීමාසහිත ආයුගණක සහ කළමනාකරණ උපදේශක (පෞද්ගලික) සමාගම විසින් සිදු කරන ලදී.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිගත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ගැන්වීම් පාරිතෝෂික සඳහා අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමල අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන වටිනාකම නියෝජනය කරයි.

මූල්‍ය කාර්ය සාධනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සියලුම ආයුගණක ලාභ සහ අලාභ ක්ෂණිකව හඳුනා ගැනේ.

වගකීම් සඳහා වූ ප්‍රතිපාදන ශේෂ පත්‍ර දිනයෙන් පසුව බාහිර වශයෙන් ආයෝජනය කර ඇත

11.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සුදුසුකම් ලත් සියළු සේවකයන් වෙනුවෙන් අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර දායකත්වයන් ලබා දී ඇත.

2013 ඔක්තෝබර් මස 1වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවක අර්ථසාධක අරමුදලේ සේවායෝජකයාගේ දායකත්වය 12% සිට 15% දක්වාද සේවාදායකයාගේ දායකත්වය 8% සිට 10% දක්වා ද ඉහළ නංවන ලදී

12. රජයේ ප්‍රදාන

දේපල, පිරියතසහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා ලබා දෙන රජයේ ප්‍රදාන කල් දැමූ ආදායමක් ලෙස හඳුනා ගන්නා අතර වත්කම්වල ප්‍රයෝජ්‍යතාවය මත වෙන් කරනු ලැබේ. ඉතිරි ප්‍රදාන එම ප්‍රදානයන් ලැබිය යුතු දෑ වන විට ආදායම ලෙස හඳුනා ගනු ලබයි.

13. වගකීම් හඳුනා ගැනීම

පවත්නා වගකීම් පියවීමක් මගින් ආර්ථික ප්‍රතිලාභ අත්කර දෙන පරිදි සිදුවන සම්පත් පිටතට ඇදී යාමක් සිදු කෙරෙන අතරල එකී පියවීම සිදු කෙරෙන ප්‍රමාණය විශ්වසනීය පරිදි මිනිය හැකි වීමේ වැඩි ශක්‍යතාවයක් පවත්නා විටදී ශේෂ පත්‍රය තුළ බැරකමක් හඳුනාගනු ලබයි. ගෙවිය යුතු දෑ ඒවාහි පිරිවැයට අනුව ප්‍රකාශ කෙරේ

ආදායම් ප්‍රකාශය

14. ආදායම හඳුනාගැනීම

14.1 විවල්‍ය ලියාපදිංචි (බලපත්‍ර) ගාස්තු

ශ්‍රී ලංකා රජය සමග එක්ව ක්‍රියාත්මක කරන ලදල ලිහිසි ද්‍රව්‍ය ගිවිසුමේල 2 වගන්තිය ප්‍රකාරල ලිහිසි ද්‍රව්‍ය වෙළඳපල සහභාගිකරුවන් විසින් දෙවසරකට වරක් රුපියල් විසි පන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්) හෝ එම කාල පරිච්ඡේදය සඳහා ඉන්වොයිසිගත සමස්ත අලෙවියෙන් 0.75%ක් හෝ යන දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු වේග එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවැනිදාට හෝ එදිනට ප්‍රථම රුපියල් විසි පන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්) ද ජූනි මස 30වන දිනටහෝ එදිනට ප්‍රථම තවත් රුපියල් විසිපන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්) ද බනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමට බැරවන සේ ගෙවිය යුතු වේග දෙවසරක කාලය තුළ වෙළඳපල සහභාගිකරුගේ ඉන්වොයිසිගත සමස්ත අලෙවියෙන් 0.75% ක ප්‍රමාණය රුපියල් විසිපන් ලක්ෂය ඉක්මවන්නේ නම්, එම කාල පරිච්ඡේදය අවසන් වී දින 30ක් ඇතුළත එම අතිරේක මුදල මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වේ.

14.2 වාර්ෂික නියාමන ගාස්තුව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වගන්තිය ප්‍රකාරල වාර්ෂික නියාමන ගාස්තුවක් පැනවීමේ බලය කොමිෂන් සභාව සතුවන අතර, එය සෑම බලපත්ලාභියෙකු වෙතින්ම අදාළ වර්ෂයේ තිස්වන දිනට පෙර අයකරගත යුතුය. මෙම පනත 2009 අප්‍රේල් මස 8වන දින සහතික කරන ලදු. එදින සිට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

14. 3 බලපත් අයදුම්පත්‍ර ගාස්තුව

බදු පැනවීමට අමතරවල ශ්‍රී ලංකා විදුලිබල පනතේ 11 වගන්තිය ප්‍රකාරල විදුලිබලය උත්පාදනයල සම්ප්‍රේෂණය හෝ බෙදාහැරීම සඳහා බලපත්‍රයක් අයැදුම් කිරීමේ දී අයැදුම්පත් සකස් කිරීමේ ගාස්තුවක් අයකර ගැනීමේ බලය කොමිෂන් සභාව සතු වේ.

14.4 පොළී ආදායම

පොළී ආදායම උපචිත පදනම මත ගණනය කරන ලදී.අදාළ ගනුදෙනුව ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාව වෙත ගලායාමේ වඩාත් ඉහළ හැකියාවක් පවත්නා විට පමණක් ආදායම හඳුනාගනු ලබයි.

15. වියදම් හඳුනාගැනීම

කොමිෂන් සභාව විසින් අනුමත අයවැය වෙන් කිරීම මත පදනම්ව ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලබයි.

16. අදාළ පාර්ශ්වයන්ගේ අනාවරණයන්

16.1 ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල හානි පූර්ණ

ප්‍රධාන කළමනාකාරීත්වකාර්ය මණ්ඩලය මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර හානි පූර්ණ විස්තර පහත පරිදි වේ.

	2020	2019
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	1,968,000	1,310,000
පශ්චාත් සේවක ප්‍රතිලාභ		
වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ		
අවසන් කිරීමේ ප්‍රතිලාභ		
එකතුව	1,968,000	1,310,000

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2020 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා

	2020	2019
	Rs	Rs
02.ආයෝජන		
ස්ථාවර තැන්පතුව	497,000,000	272,000,000
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	17,868,339	16,549,964
	514,868,339	288,549,964

03. භාණ්ඩ ලේඛන	76,303	205,783

04. ලැබිය යුතු දෑ		
විවිධ ලියාපදිංචි ගාස්තුව		
වෙව්රෝන් ලුබ්රිකන්ට් ලංකා	38,920,488.79	35,747,304.00
ලංකා අයි.ඕ.සී. සමාගම	12,879,182.00	9,105,864.89
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	1,967,587.06	8,031,852.00
ලංකා බනිජ තෙල් සංස්ථාව	2,000,000.00	8,470,792.84
ලාෆ්ස්	7,336,578.87	5,143,354.03
ඉන්ටර්ඕෂන්ස් සර්විසස් ලිමිටඩ්		29,203.00
ඇසෝසියේටඩ් මෝටර් වේස්	500,000.00	1,370,847.00
ටී.වී.එස්. ලංකා පුද්ගලික සමාගම (භාරත් පෙට්‍රෝලියම් කෝපරේෂන්.)	1,781,924.49	3,501,677.00
යුනයිටඩ් මෝටර්ස්	2,402,057.21	1,200,311.41
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	8,556,885.38	7,881,455.00
එන්.එම්. ඩිස්ට්‍රිබියුටර්ස් පුද්ගලික සමාගම	2,683,559.12	3,858,498.12
	79,028,262.92	84,341,159.29
වාර්ෂික නියාමන ගාස්තු	82,904,420.80	184,934,924.60
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය	5,203,929.24	4,533,031.58
අනිකුත් ලැබිය යුතු දෑ	85,449.27	109,016.34
	167,222,062.23	273,918,131.81

05. තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවුම්		
තැන්පතුව		
ඩිපොසිට් ඩයලොග් ඇක්සියාටා පී.එල්.සී.	1,500	1,500
බී.ඕ.සී. ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්	826,571	826,571
ග්‍රිල් ප්‍රෙන්ඩිලි ඇසෝසියේෂන්	57,500	48,500
	885,571	876,571
අත්තිකාරම් සහ පෙර ගෙවුම්		
අත්තිකාරම්	9,000	1,404,940

තැපැල් දෙපාර්තමේන්තුව	18,457	36,235
පෙර ගෙවුම්	4,305,241	5,078,819
සම්පත් වෙඩ් කාඩ්	3,847	
	4,336,545	6,519,994
ආපදා ණය	2,491,785	1,427,243
උත්සව අත්තිකාරම්	25,200	126,400
සමස්ත තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවුම්	7,739,100	8,950,207

06. සමුච්චිත අරමුදල		
2020 ජනවාරි 1 දිනට ශේෂය	528,251,661	426,945,055
20/12/31 දිනට අතිරික්තය/(හිඟය)	146,775,974	99,358,522
පෙර වසරේ ගැළපුම්(6.1)	-	1,948,084.56
	675,027,631	528,251,661
6.1 පෙර වසරේ ගැළපුම් පිළිබඳ අනාවරණය 2020 ප්‍රවර්ගය		
ප්‍රවර්ගය		
C & E නඩත්තුව	-	(152,138)
සන්නිවේදනය සහ පුවත්පත්	-	116,008
දායකත්වය	-	629,176
ගෙවිය යුතු විගණන ගාස්තු	-	52,400
උපදේශනය	-	420,972
පාරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය	-	44,811
ක්ෂයවීම්	-	(6,165,421)
භාණ්ඩ ලේඛන	-	67,731
පර්යේෂණ සහ සමීක්ෂණ	-	4,964
වෛද්‍ය රක්ෂණය	-	965,767
මහජන දැනුවත්කිරීම්	-	(1,133,958)
විවිධ ලියාපදිංචි ගාස්තුව	-	3,201,603
වෙනත්	-	
එකතුව	-	(1,948,085)

07. ගෙවිය යුතු ගිණුම		
මුද්‍රණය සහ වෙළඳප්‍රචාරණය	3,038,080	2,701,686
සන්නිවේදනය	405,645	428,433
මල් සැකසුම්	-	11,893
අනිකුත් දීමනා	138,647	3,833,459
පුවත්පත්	9,420	14,460
අතිකාල	60,114	193,811
ප්‍රවාහනය	-	52,051
ගමන්	18,750	78,125
විදේශ ගමන්	-	13,000
වෙනත් ගිවිසුම්	465,473	-
කාර්යාල ගොඩනැගිලි නඩත්තුව	-	1,047

කාර්යාල වාහන නඩත්තුව	-	249,321
ජලය	12,833	17,684
විදුලිය	95,413	100,194
මහජන දැනුවත්කිරීම	180,413	3,206,765
උපදේශනය	8,772,303	27,318,543
ගෙවිය යුතු මුද්දර ගාස්තු	5,225	4,175
සනීපාරක්ෂක සේවා	90,270	106,961
තැපැල්	17,475	3,893
රක්ෂණය	3,592	11,140
ගෙවිය යුතු සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	-	-
මුදල් රඳවාගැනීම	199,952	199,951
උපචිත පරිගණක සහ උපකරණ	1,042,680	625,160
උපචිත ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	-	3,185,334
නෛතික වියදම්	-	35,000
පරිගණක සහ උපකරණ නඩත්තුව	-	1,397,228
ලිපිද්‍රව්‍ය	-	45,153
පර්යේෂණ සහ සමීක්ෂණ	-	47,500
පාරිභෝජනයට ගත හැකි ද්‍රව්‍ය	-	13,240
SAARC	-	-
පරිවර්තන	189,598	35,608
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	-	229,699
අනෙකුත් ගෙවිය යුතු	151,269	105,000
	14,897,151	44,265,513

08. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		
2020 ජනවාරි 01 වන දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන	14,888,340	12,803,688
කාල සීමාව සඳහා පොලී පිරිවැය	1,563,276	1,536,443
කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය	1,851,209	1,788,992
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(157,710)	(1,453,313)
PV-DBO හි සත්‍ය ලාභය/අලාභය	(1,171,741)	212,530
2020 දෙසැම්බර් 31 වන දිනට ඡඬ-ඇර්ධ සඳහා ප්‍රතිපාදන	16,973,374	14,888,340

08.1 උපකල්පන		
කාර්ය මණ්ඩල පිරිවැටුම	6% Up to age 54 & thereafter zero	2% Up to age 54 & thereafter zero
විශ්‍රාමික වයස	60	60
වට්ටම් අනුපාතය	8%	10.5%
වැටුප් වර්ධක අනුපාතය	5%	8.5%

08.2 සංවේදීතා විශ්ලේෂණය		

අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින අතර විචල්‍යය වෙනස් වේ		
වට්ටම් අනුපාතය 1% වැඩි වීම	15,987,598	13,680,044
වට්ටම් අනුපාතය 1% අඩු වීම	18,084,249	16,292,293
වැටුප් වර්ධක අනුපාතය 1% කින් වැඩි කිරීම	18,132,669	16,331,608
වැටුප් වර්ධක අනුපාතය 1% කින් අඩු වීම	15,929,633	13,627,985

09. විගණකාධිපති ගාස්තු		
ඉදිරියට ගෙන ආ ශේෂය	1,627,600	1,863,700
වසර තුළ ගෙවීම්	(1,497,600)	(1,138,500)
2020 වසර සඳහා ප්‍රතිපාදන	800,000	850,000
Over/Under චරදඩසිසදබ දෙර ජරසදර ශෑර 2019 2020 පෙර වසර සඳහා අධි/ඌන ප්‍රතිපාදන	(130,000)	52,400
	800,000	1,627,600

10. විවිධ ලියාපදිංචි ගාස්තු		
ලංකා අයි.ඕ.සී. සාමගම	18,521,384.24	13,334,565
වෙව්රෝන් ලුබ්රිකන්ට් ලංකා	74,434,400.84	72,834,173
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	7,949,202.98	15,573,140
ලංකා බනිජ තෙල් සංස්ථාව	3,847,082.80	6,500,606
ලාෆ්ස් ලුබ්රිකන්ට්ස් ලිමිටඩ්	10,995,904.71	9,889,398
ඉන්ටර්ඕෂන්ස් සර්විසස් ලිමිටඩ්	-	62,500
ඇසෝසියේටඩ් මෝටර් වේස්	1,155,372.00	2,845,867
ටී.වී.එස්. ලංකා පුද්ගලික සමාගම	3,519,168.49	6,871,300
යුනයිටඩ් මෝටර්ස්	3,079,497.16	1,935,348
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	14,651,390.63	15,139,828
එන්.එම්. ඩිස්ට්‍රිබියුටර්ස් පුද්ගලික සමාගම	3,475,889.36	4,468,782
	141,629,293	149,455,507
අඩු කළා: දෝෂ නිවැරදි කිරීම සහ අධි ප්‍රතිපාදන ප්‍රතිවර්තනය	(483,887)	-
	141,145,406	149,455,507
11. වාර්ෂික නියාමන බදු		
උත්පාදනය	58,400,781	57,433,457
සම්ප්‍රේෂණය	24,554,800	24,076,400
බෙදාහැරීම	106,863,400	103,792,400
	189,818,981	185,302,257

12. බලපත් අයදුම්පත්‍ර ගාස්තු	474,000	513,000
	474,000	513,000

13. වෙනත් ආදායම්		
පොලිය	27,571,802	22,523,767
නිදහස් කිරීමේ ගාස්තුව	9,000	13,000

විවිධ ආදායම	185,509	371,175
ජංගම දුරකථන ලබා ගැනීම සඳහා සේවකයින් විසින් ගෙවන මුදල	-	15,160
ආදායම:ස්ථාවර වත්කම් බැහැරකිරීම	(81,120.18)	93,569
ප්‍රතිපාදන- පුනරාවර්තන		2,000,000
පාරිතෝෂික ප්‍රතිපාදන මත ආයුගණක වාසි	-	-
	27,685,191	25,016,671

14.පුද්ගල පිරිවැය		
පුද්ගල පාරිශ්‍රමික		
කොමසාරිස්වරයාගේ පාරිශ්‍රමික:	1,694,000	1,426,548
වැටුප්	59,117,662	56,258,985
අනිකුත් දීමනා	37,795,786	39,439,547
අතිකාල	1,146,437	1,567,030
සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය	8,860,486	8,448,592
සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය	1,772,097	1,697,432
පාරිතෝෂික වියදම	3,414,485	3,325,435
	113,800,954	112,163,568

15.ගමනෙයුම් පිරිවැය		
පුහුණු හා ගමන් වියදම් -විදේශීය හා දේශීය		
විදේශීය හා දේශීය පුහුණු	678,918	2,392,151
විදේශ ගමන් වියදම්	186,500	160,415
අහඹු/දෛනික	-	716,291
ගමන් (දේශීය)	156,140	658,225
	1,021,558	3,927,082
පාරිභෝජනයට ගත හැකි ද්‍රව්‍ය		
ලිපිද්‍රව්‍ය	1,184,736	1,080,963
ඉන්ධන සහ වාහන ගාල්කිරීම්	4,498,444	4,405,829
පාරිභෝජනයට ගත හැකි ද්‍රව්‍ය	168,991	297,077
විනෝදාස්වාද	37,684	214,439
	5,889,855	5,998,309
කොන්ත්‍රාත්තු සේවා		
ප්‍රවාහන සහ වාහන කුලී	11,045,672	10,550,992
පුවත්පත් සහ තැපැල් ඇතුළු සන්නිවේදනය	3,742,983	4,184,132
මුද්‍රණය සහ වෙළඳ ප්‍රචාරණය	6,253,876	6,961,743
සමීක්ෂණ	(47,500)	49,000
ගොඩනැගිලි සඳහා බදුකුලී සහ අනුපාත	18,559,912	20,609,910
විදුලිය	1,166,848	1,333,294
වෛද්‍ය	5,173,561	6,670,334
ජලය	211,710	274,443

රක්ෂණය	370,451	786,743
දායකත්වය	-	209,725
සනීපාරක්ෂක සේවා	1,051,615	1,493,142
නෛතික සහ විමර්ශන ගාස්තු	1,566,500	5,891,757
වෙනත් ගිවිසුම්	836,286	-
	49,931,915	59,015,216
වෙනත් සේවාවන්		
මහජන දැනුවත් කිරීම් පිරිවැය	11,832,116	20,521,765
විගණකාධිපති ගාස්තුව	670,000	850,000
සුභසාධන සහ මහජන සම්බන්ධතා	281,386	211,861
මල් සැකසුම්	31,860	72,865
සේවානියුක්ති නියැලීම	-	499,304
SARRC වැඩසටහන	-	-
විවිධ හා වෙනත්	472,205	219,814
	13,287,567	22,375,608
ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සහ ක්ෂය කිරීම		
වාහන නඩත්තුව	1,154,103	1,564,334
කාර්යාල ගොඩනැගිල්ල නඩත්තුව	20,852	58,976
පරිගණක, උපකරණ සහ මෘදුකාංග නඩත්තුව	3,313,804	6,092,492
ගෘහභාණ්ඩ සහ සවිකිරීම් නඩත්තුව	-	-
ක්ෂයවීම් ගාස්තු	19,631,935	21,399,947
	24,120,693	29,115,750
සමස්ත මෙහෙයුම් පිරිවැය	94,251,588	120,431,964

16. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	11,185	9,835
විනිමය මාරුකිරීම්වලින් අලාභ	-	2,056
	11,185	11,891

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
දේපළ පිරියත හා උපකරණ
2020 දෙසැම්බර් 31 දිනට

	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	පරිගණක හා කාර්යාලීය උපකරණ	කාර්යාලීය උපකරණ	වාහන	එකතුව	මෘදුකාංග	එකතුව
	Rs	Rs		Rs	Rs	Rs	Rs
වර්ෂය ආරම්භයේ දී	21,127,734	47,117,572	515,279	25,390,000		12,927,258	107,077,843
වසර තුළ එක් කිරීම්	59,600.00	2,825,170				229604.33	3,114,374
මාරුකිරීම්							
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වත්කම් වලින් මාරු කළ අගය	3,157,967					2,145,160	5,303,127
ප්‍රත්‍යාගණනය ඇගයුම්කරණය							
වසර තුළ ඉවත් කිරීම්	(679,022)	(1,362,676)					(2,041,698)
වර්ෂ අවසාන ශේෂය	23,666,279	48,580,066	515,279	25,390,000	-	15,302,022	113,453,646

ක්ෂයවීම්							
වර්ෂය ආරම්භයේ දී	14,441,145	31,956,413	422,014	7,046,667	-	9,874,450	63,740,689
වසර සඳහා අයකිරීම්	2,778,030	7,479,423	61,347	7,046,667		2,266,467	19,631,934
පෙර වසරේ ගැලපීම්							
මාරුකිරීම්							
බැහැර කිරීම් මත ක්ෂයවීම්	(612,445)	(1,224,249)					(1,836,693)
වර්ෂාවසානයේ දී ශේෂය	16,606,730	38,211,587	483,361	14,093,333	-	12,140,917	81,535,929
2020 දෙසැම්බර් 31	7,059,549	10,368,478	31,918	11,296,667	-	3,161,105	31,917,717
දිනට ශුද්ධ පොත් අගය							

විගණන කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 2020

විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

2010 දෙසැම්බර් 14 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබෙන අංක පීඩී /55 දරන චක්‍රලේඛය අනුව 2020 වර්ෂය සඳහා පහත සඳහන් නිලධාරීන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත්කර තිබුණි

සාමාජිකයාගේ නම	විගණන හා කළමනාකරණ කමිටුවේ දරන තනතුර	නිලධාරියාගේ නිත්‍ය තනතුර
1.පී. ඩී. සී. ඒකනායක මහත්මිය	සභාපති	උප සභාපති - මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2.සදුන් ගමගේ මහතා	උප සභාපති	සාමාජික - මහජන උපයෝගිතා කොමිෂන් සභාව
3.ජානකී විතානගම මහත්මිය	ලේකම්	ලේකම් - මහජන උපයෝගිතා කොමිෂන් සභාව
4.කේ. එස්. එම්. ද සිල්වා මහතා	භාණ්ඩාගාර නියෝජිත	නියෝජ්‍ය අධ්‍යක්ෂක - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
5.ඩබ්. එච්. ඒ. විමලජීව මහත්මිය	රෙබීය අමාත්‍යංශ නියෝජිත	ප්‍රධාන ගණකාධිකාරී - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය
6.ටී. ආර්. එම්. වීරරත්න මහත්මිය	විගණකාධිපතිගේ නියෝජිත	විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
7.එම්. පී. ධර්මරත්න මහතා	කැදවුම්කරු	අභ්‍යන්තර විගණක - මහජන උපයෝගිතා කොමිෂන් සභාව
8. දමිත කුමාරසිංහ මහතා	සාමාජික	අධ්‍යක්ෂ ජනරාල් - මහජන උපයෝගිතා කොමිෂන් සභාව
9. තිළිණ රණසිංහ මහතා	සාමාජික	අධ්‍යක්ෂ (මූල්‍ය) - මහජන උපයෝගිතා කොමිෂන් සභාව

2020 වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර තුනක් පවත්වනු ලැබූ අතර එම රැස්වීම් වලදී ඉදිරිපත් වූ කරුණු සලකාබලා පහත සඳහන් නිර්දේශයන්ට එළඹ තිබුණි.

1. කොමිෂන් සභාව මගින් පනතේ නියමයන් පරිදි සකස්කර තිබෙන මූල්‍ය උපදෙස් සංග්‍රහයේ වගන්ති අංක 17.5 යටතේ කාලීනව ඉදිරිපත් කළයුතු වාර්තා යටතේ දක්වා තිබෙන වාර්තා නියමිත දිනයන් වලදී අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කලයුතු බව සහ එම වාර්තා ඉදිරිපත් කිරීමේ තත්ත්වය ඊළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සිට ඉදිරිපත් කළයුතු බව නිර්දේශ කිරීම සහ ඊට අතිරේකව කාර්යමණ්ඩල විස්තර කාර්තුව තුළ නිකුත්කල හා ලැබෙන අභ්‍යන්තර හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් හා වාර්තා පිළිබඳ විස්තරයක්ද ඉදිරිපත් කිරීම සුදුසු බව.

2. රටේ පවතින වාතාවරණය මත 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන මූල්‍ය හා භෞතික ප්‍රගතීන් සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයන් පවතින බැවින් එම ක්‍රියාකාරී සැලැස්ම නැවත සංශෝධනය කර 2020 දෙසැම්බර් 31 දිනට ලඟාකරගත හැකි ඉලක්ක පමණක් ඇතුළත් වනසේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අනුමත කර ඉදිරි කාල පරිච්ඡේදය සඳහා ක්‍රියාත්මක කිරීම සුදුසු බව නිර්දේශ කිරීම.

3. 2020 ජනවාරි 01 දිනට අයවීමට ඇති විවිධ ලියාපදිංචි ගාස්තු හා වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර ඒ පිළිබඳ විස්තර නිවැරදිව වාර්තා කලයුතු බව නිර්දේශ කිරීම හා මුදල් නොගෙවන ආයතන වෙනුවෙන් හිඟ ගාස්තු ගෙවන ලෙස දන්වා අවසන් නිවේදන යැවීමටත් එම නිවේදන යවා දින 14 කට පසුව තවදුරටත් මුදල් ගෙවා නොමැති ආයතන තිබේනම් ඔවුන්ගේ බලපත්‍ර අවලංගු කිරීම සුදුසු බව නිර්දේශ කර අමාත්‍යංශයට දැනුම් දීම සුදුසු බව නිර්දේශ කිරීම.

4. 2020 මාර්තු, අප්‍රේල් හා මැයි යන මාසවලදී නිවසේ සිට රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා තම පෞද්ගලික දුරකතන භාවිතා කළ කළමනාකරණ සේවයේ නිලධාරීන්ට ඔවුන් ඒ වෙනුවෙන් දරා තිබෙන වියදම ප්‍රතිපූරණය කිරීමක් ලෙස එක් මසකට රු: 2,500 ක් බැගින් අදාළ කාලය තුළ රු:5,000 ක උපරිම මුදලක් වන ලෙස එක් වතාවක් පමණක් ගෙවනු ලබන දීමනාවක් ලෙස ගෙවීම් කිරීම සුදුසු බව නිර්දේශ කිරීම.

5. 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන්සභා පනතේ නියමයන් පරිදි මහජන උපයෝගිතා කර්මාන්ත ලෙස ගැනෙනුයේ විදුලිය, ජලය හා ඉන්ධන යන විෂයයවලට අදාල කර්මාන්ත වන බැවින් එම කර්මාන්ත නියාමනය කිරීම කොමිෂන් සභාවට පැවරී ඇත.

විදුලිය ආශ්‍රිත කර්මාන්ත නියාමනය සඳහා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ප්‍රතිපාදන ලබාදී ඇතත් බනිජතෙල් හා ජලසේවා කර්මාන්ත නියාමනයට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පනත් සංශෝධනය කර ලබාගෙන නොමැත. එබැවින් එම සේවාවන් නියාමනය කිරීම අවශ්‍ය බැවින් අදාළ පනත් දෙකම සංශෝධනය කර එම ආයතන නියාමනය කිරීමට කටයුතු යෙදීම සුදුසුබව නිර්දේශ කිරීම.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා පැමිණි නිලධාරීන් -2020

සාමාජිකයාගේ නම	විගණන හා කළමනාකරණ කමිටුවේ දරන තනතුර	පළමු රැස්වීම	දෙවන රැස්වීම 20/08/2020	තෙවන රැස්වීම 02/12/2020
1.පී. ඩී. සී. ඒකනායක මහත්මිය	සභාපති	Ö	Ö	Ö
2.සදුන් ගමගේ මහතා	උප සභාපති	Ö	Ö	Ö
3.ජානකී විතානගම මහත්මිය	ලේකම්	Ö	Ö	Ö
4.කේ. එස්. එම්. ද සිල්වා මහතා	භාණ්ඩාගාර නියෝජිත	Ö	Ö	Ö
5.ඩබ්. එච්. ඒ. විමලජීව මහත්මිය	රෙබීය අමාත්‍යංශ නියෝජිත	Ö	Ö	Ö
6.ටී. ආර්. එම්. වීරරත්න මහත්මිය	විගණකාධිපතිගේ නියෝජිත	Ö	Ö	Ö
7.එම්. පී. ධර්මරත්න මහතා	කැදවුම්කරු	Ö	Ö	Ö
8. දමිත කුමාරසිංහ මහතා	සාමාජික	Ö	Ö	Ö
9. තිළිණ රණසිංහ මහතා	සාමාජික	Ö	Ö	Ö

2020 වර්ෂයේදී පැවත්වුණු විගණන කමිටු රැස්වීම්වල විස්තර